# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 81 — 1973 ඔක්තෝබර් 12 වැනි සිකුරාද — 1973.10.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පලාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| පලාත් පාලන නිවේදන ... ... ... | 995 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 997 | අය-වැය ලේඛන ... ... ... | 1001 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පලාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | 1001 | විවිධ දැන්වීම් ... ... ... ... | 1006 |



**සැලකිය යුතුයි.**—(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 39 දරණ විනිමය පාලන (සංශෝධන) පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 40 දරණ දුම්කොළ බදු (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 41 දරණ ණය සහනදායක (සංශෝධන) පනත සහ විසර්ජන පනත් කෙටුම්පත 1973 ඔක්තෝබර් 12 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ,

(ii) කාර්මික ආරවුල් (විශෙෂ විධිවිධාන) පනත් කෙටුම්පත 1973 ඔක්තෝබර් 05 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

## පලාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 29/62.

**තෙල්දෙනිය සුළු නගර සභාව**

ගෝ ඝාතක ආඥාපණත

(272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වෙනි වගන්තිය යටතේ නිසි බලධරයා විසින්, එනම් තෙල්දෙනිය නගරයේ විශේෂ කොමසාරිස් විසින් සම්පාදිතව, එකී වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් ස්ථිර කරන ලද නියෝග.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 9. 22 දින,
කොළඹදී ය.

**නියෝග**

ගෝ ඝාතක ආඥාපනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද පොදු ගෝ ඝාතක ස්ථානය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ යම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුගේ භාරයේ තිබිය යුතුය. එකී ගෝ ඝාතක ස්ථානය ඇතුළත වූ විනය පාලනය සහ සනීපාරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් ඒ නිලධාරියා වගකිව යුතුය.

2. කිසිම තැනැත්තකු විසින් ගෝ ඝාතක ස්ථානයේදී යම් සතකු—

(අ) මරනු ලැබීමට ප්‍රථම, සභාව විසින් සපයා ඇති හරක් කොටුවේ පැය 24 කට නොඅඩු කාල සීමාවක් ඒ සතා තබනු ලැබුව හොත් මිස ඒ සතා නොමැරිය යුතුය;

(ආ) ඒ ප්‍රදෙශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ යම් කිසි මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු විසින් හෝ, ඒ කාර්යය සඳහා ඔහු වෙනුවෙන් වැඩ බලන නිලධරයෙකු විසින් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර තිබේ නම් මිස ඒ සතා නොමැරිය යුතුය;

(ඇ) යම් දිනයක පූ.භා. 6 ටත් අ.භා. 6 ටත් අතර කාලයේදී මිස නොමැරිය යුතුය. එසේ වුවද, විශේෂ අවස්ථාවලදී මෙසී නිශ්චිතව සඳහන් වේලාවට වඩා වෙනස් වූ යම් වේලාවක යම් සතෙකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය;

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම් සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. ඩී. සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1973 ජනවාරි මස 7 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

(ඈ) 2(ආ) වැනි ඡේදය යටතේ අනුමත කරනු ලැබූ වේලාවෙන් පැය 30ක කාල සීමාවක් ඉකුත් වී යාමෙන් පසු යම් අවස්ථාවකදී ඒ සතා නොමැරිය යුතුය; තවද,

(ඉ) 2(ආ) ඡේදය යටතේ අනුමත කරනු ලැබූ පසු ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියෙන් පිටතින් ඉවත් කරන ලද්දේ නම්, නැවතත් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු යයි එකී ඡේදය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස ඒ සතා නොමැරිය යුතුය.

3. 2(අ) වැනි ඡේදයේ සඳහන් හරක් කොටුවට අයත් භූමි භාගයකට හෝ ගෝ ඝාතක ස්ථානයකට අයත් භූමි භාගයට යම් සතෙකු ගෙන එන සෑම තැනැත්තෙකු විසින් ම ඒ සතා ඒ භූමි භාගයේ නවත්වා සිටින කාලය තුළ ඒ සතාට ප්‍රමාණවත් පරිදි කෑම බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය විය හැකි සෑම විධි විධානයක් ම සැලැස්විය යුතුය.

4. හරක් කොටුවට අයත් ස්ථානයට හෝ ගෝ ඝාතක ස්ථානයට අයත් භූමි භාගයට යම් සතෙකු ගෙන එන සෑම තැනැත්තෙකු විසින්ම ඒ සතා මරණු ලැබීමට සුදුසු නැතැයි ගෝ ඝාතක ස්ථානය භාර නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ගෝ ඝාතක ස්ථානය පිහිටි භූමි භාගයෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරවිය යුතුය.

5. යම් සතෙකු 2(ආ) වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළ පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාරය පිණිස මරණු ලැබීමට නුසුදුසු බව පෙනී ගියහොත් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ 2(ආ) වැනි නියෝගයෙන් බලය පවරනු ලැබූ නිලධරයා විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

6. ගෝ ඝාතක ස්ථානයේදී මරණ ලද යම් සතෙකුගේ මස් හෝ මාංශාවශේෂ ආදිය 2(ආ) වැනි නියෝගයෙහි සඳහන් යම් නිලධරයෙකුගේ මතය අනුව ලෙඩ සහිතව හෝ මනුෂ්‍ය ආහාරයට නුසුදුසුව තිබේනම්, ඒ මස් හෝ අවමස් ආදිය වහාම විනාශ කර දැමීමට ඔහු විසින් සැලැස්විය යුතුය. එසේ නැතහොත් ඒ මස් හෝ අවමස් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාරය පිණිස ගැනීම හෝ වළකින අන්දමින් ඉවත් කරවිය යුතුය.

7. මනුෂ්‍ය ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර නැත්තාවූ හෝ 4 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ හෝ යම් සතෙකු මස් පිණිස මැරීමට ගෝ ඝාතක ස්ථානය භාර නිලධරයා විසින් අවසර නොදිය යුතුය.

8. කිසිම තැනැත්තෙකු විසින්—

(අ) මනුෂ්‍ය ආහාරය සඳහා නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශිත යම්කිසි මසක් හෝ අවමස් ආදියක් 2(ආ) නියෝගයෙහි සඳහන් නිලධරයෙකුගේ නියමය යටතේ හැර ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

(ආ) මිනිසුන්ගෙ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතෙකුගේ මළකුණේ ඉස්සරහ ගාත්වලත් පස්සා ගාත්වලත් ගෝ ඝාතක ස්ථානය භාර නිලධාරියා විසින් "අනුමත කරන ලද මස්" යන සලකුණ ද "තෙල්දෙනිය සුළු නගර සභාව" යන වචනද අදාල දිනය ද යොදා තිබේ නම් මිස ඒ මළකුණ ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

9. වෙනත් යම් සතෙකු ඉදිරිපිටදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරන ලද සෑම සතෙකුගේම මළකුණ ඉවත් කරනු ලැබ හෝ ආවරණය කරනු ලැබ, ඒ ස්ථානය පිරිසිදු කරන තුරු කිසිම සතෙකු නොමැරිය යුතුය.

10. යම්කිසි බෝවන රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ සමේ රෝගයකින් පෙළෙන හෝ ලඟදී පෙළෙමින් සිටි හෝ එබඳු රෝගයකින් පෙළෙමින් හිඳි තැනැත්තෙකුට ළඟදී සාත්තු කිරීමේ යෙදී සිටි කිසිම තැනැත්තෙකුට එකී රෝගය බෝවන කාල සීමාව හෝ විෂබීජ මේරීමට ගතවන කාලසීමාව ඉකුත් වන තුරු යම් ගෝ ඝාතක ස්ථානයට ඇතුළුවීමට හෝ යම් සතෙකු මැරීමේ කටයුතු වල යෙදීමට ඒ ගෝ ඝාතක ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් අවසර නොදිය යුතුය.

11. සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ සභාපති විසින් හෝ සභාපති විසින් යථා පරිදි බලය පවරනු ලැබූ යම් කිසි නිලධාරියෙකු විසින් සුදුසු සියලුම අවස්ථාවලදී ඕනෑම ගෝ ඝාතක ස්ථානයකට ඇතුල්ව එකී ස්ථානය පරීක්ෂා කර බලනු ලැබීම නිත්‍යානුකූල විය යුතු අතර, එම ස්ථානය භාරකරු විසින් අවශ්‍ය විය හැකි සියලුම ආධාර ඔහුට දිය යුතුය.

12. සභාව විසින් පිහිටුවා ඇති ගෝ ඝාතක ස්ථානය පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් සභාවට කලින් ගෙවිය යුතු අතර, අය විය යුතු ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් සභා කාර්යාලයෙන් ලබා ගත් කුවිතාන්සියක් නැතිව කිසිම සතෙකු මරනු නොලැබිය යුතුය:—

ගවයින් සඳහා එකෙකුට රු. 2. 00

එළුවන් සඳහා එකෙකුට රු. 1.00

13. ගෝ ඝාතක ස්ථානයෙහි දී මරණ ලද එක් එක් සතා පිළිබඳ විස්තර ලේඛනයක් සභාවේ සභාපති විසින් නියම කරනු ලබන ආකෘතිය අනුව ගෝ ඝාතක ස්ථානයේ භාරකරු විසින් තබා ගත යුතුය.

14. මේ නියෝගවල—

"සතා" යනනෙන් යම් ගවයෙක්, එළුවෙක් හෝ ඌරෙක් අදහස් වේ.

"ගවයා" යන්නට මී හරකුන් හැර සියලුම ගවයන් අදහස් වේ.

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යන්නෙන් තෙල්දෙනිය සුළු නගර සභාව අදහස් වේ.

"සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා" යන්නෙන් වත්තේගම සෞඛ්‍ය නිලධරයා අදහස් වේ.

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් තෙල්දෙනිය නගරයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ ඔහු වෙනුවට වැඩ බලන යම් සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් අදහස් වේ.

"භාරකාර නිලධරයා" යන්නෙන් වත්තේගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම්කිසි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් අදහස් වේ.

"හරක් කොටුව" යන්නෙන් සභාව විසින් පිහිටුවන ලද හරක් කොටුව අදහස් වේ; තවද,

"ගෝ ඝාතක" යන්නෙන් සභාව විසින් බලපත්‍ර දී තිබෙන යම් ගෝ ඝාතකයෙක් අදහස් වේ.

10-287—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## නගර හා ග්‍රාම නාම වෙනස් කිරීම

මෙහි පහත සඳහන් පළමුවැනි උපලේඛණයේ ඇති ග්‍රාම නාමය දෙවැනි උපලේඛණය ප්‍රකාරව වෙනස් කරන්නට යෙදුන බව පොදු දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1973 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දීය.

| දිස්ත්‍රික්කය | පළමුවැනි උපලේඛනය | දෙවැනි උපලේඛනය |
|---|---|---|
| අම්පාර | ගොනාගොල්ල | සෙනරත්පුර |

10-451—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

### චුන්නාකම් සුළු නගර සභාව—යාපනය දිස්ත්‍රික්කය

පහත සඳහන් අයගෙන් සමන්විත නිල කමිටුවක් :—

1. කේ. නල්ලයිනාදන් මහතා ... යාපනය දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් (සභාපති).
2. පී. එල්. පැට්‍රික් මහතා ... ප්‍රාදේශීය උප දිසාපති, වැලි දකුණු, චුන්නාකම්.
3. කේ. රාසරත්නම් මහතා ... සහකාර මැණුම් අධිකාරි, යාපනය.

පහත සඳහන් කරුණු පරීක්ෂා කර බලා වාර්තා කිරීම පිණිස පත්කර ඇති බව මෙයින් නිවේදනය කරමි :—

(1) වර්තමාන සුළු නගර සභා ප්‍රදේශයට යාබදව පිහිටි ප්‍රදේශයේ ආදායම් මාර්ග, ජනගහනය ලබා ඇති දියුණුව, මතුවට බලාපොරොත්තු වන දියුණුව අනුව ගතයුතු පියවර ආදිය සලකා බලා සුළු නගර සභා ප්‍රදේශයේ සීමා දීර්ඝ කළ යුතු ද, එසේ නම් ඒ කවර අන්දමින්ද ?.

(2) ජනගහනය, ඡන්දදායක සංඛ්‍යාව විශාලත්වය හා වෙනත් පොදු අයිතිවාසිකම් ගැන සලකා බැලීමේදී දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ නැවත බෙදිය යුතුද?.

(3) මෙම සුළු නගර සභාවේ තත්ත්වය නගර සභාවකට උසස් කළ යුතුද ?.

මේ සම්බන්ධයෙන් නියෝජනයන් ඉදිරිපත් කිරීමට කැමති සංවිධාන හා මහජනයා 1973 ඔක්තෝබර් මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම එවැනි නියෝජනයන් ලිඛිතව තෙපිටපතකින් යුක්තව යාපනයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලියා පදිංචි තැපෑලෙන් එවන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

කේ. නල්ලයිනාදන්,
නිල කමිටුවේ සභාපති හා පළාත් පාලන සහකාර කොමසාරිස්,
යාපනය.

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
යාපනය, 1973. 10. 01 දිනය.

10–346—73.10.12 දින අංක 81 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

17 (5) වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත, ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17(5) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අම්පාර ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, රාමචන්ද්‍රන් රුද්‍රනාදන් වන මම, අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පානම ගම්සභාවට සභාපතිවරයෙකු තෝරා පත් කර ගැනීම සඳහා එම ගම්සභාවේ රැස්වීමක් 1973 ඔක්තෝබර් මස 23 (1973.10.23) වැනි දින දී පස්වරු 2 ට පානම ගම්සභා කාර්යාලයේ දී කැඳවා සිටිමි.

ආර්. රුද්‍රනාදන්,
අම්පාර ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
කච්චේරිය, අම්පාර,
1973 ඔක්තෝබර් මස 01 වැනි දින දීය.

10–454—73.10.12 දින අංක 81 දරන ගැසට් පත්‍රය

---

# තනතුරු — ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජනරජයේ IV වැනි කොටසේ පළකෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලි 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවය භාරගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම, පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6 ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදාළ නිලධාරීතැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිළධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුදහරිනු ලැබ, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂාවේ. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිළධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහිද විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින් ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන නිළධාරීන්ට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අදාළ නොවනු ඇත. එහෙත්, ස්ත්‍රීන්ද, වයස අවුරුදු 55ට වැඩි නිළධාරීන්ද, පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට පෙර, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිළධාරීන්ද හැර, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සිට වෙනත් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට උසස් කරන හෝ පත්කරන ලද සියලු දෙනාටම 1952 ජූනි 30 වන දින හා 10,329 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිළධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඉ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකිය.

(ඊ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයේ අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(උ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(ඌ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(එ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුය.

4. **පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3 ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දැනට පවත්නාවූත් හෝ මින්මතු සම්පාදනය කළ හැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලටත් එකඟවීමේ කොන්දේසියට සියළුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරී කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහිලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලයෙන් වැඩ කිරීමේ දැනුමක් ලබාගත යුතුය.

6. විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ට සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ. පො. ස. (උසස් පෙළ):—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ට සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ?

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ?

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා, නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ.පෙ. 530, කොළඹ 1.

5. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1973. 11. 12 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි 13 වැනි ශීර්ෂය වෙනුවට, මේ කරුණු යොදා ගන්න :—

"13. (අ) වෑල්ඩිං දෝෂවලට හේතු සහ ඒවා වළක්වන හැටි හා වෑල්ඩිං කිරීමට පළමු වාත්තු කිරීම් රත්කිරීමෙහි ඇති වැදගත්කමද යන්‍රාදිය පිළිබඳව 2 වන ශ්‍රේණියේ මට්ටමේ හැකියාව.

(ආ) කියවීමට, ලිවීමට හා වාර්තා තබාගැනීමේ හැකියාව.

(ඇ) පළපුරුද්ද."

උප්පැන්න සහතිකය සහ අනිකුත් සහතිකවල පිටපත් (මුල් සහතික නොව) අයදුම්පතට අමුණා එවිය යුතුයි. මේ ලියවිලිවල පිටපත් නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

8. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන පළාත් පාලන සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණ බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

10. තෝරාගනු ලබන අපේක්ෂකයා තමන් පත්කරන පළාත් පාලන ආයතනයේ සීමාව තුළ පදිංචිවීම අවශ්‍ය විය හැකිය.

11. අවශ්‍ය සුදුසුකම් ඇති ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 2 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

10-343—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

# පළාත් පාලන සහා ජන්ද ආඥාපණත යටතේ දැන්වීම්

**ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)**

පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති දිස්ත්‍රික්ක සඳහා ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 4 (1) (සී) වැනි වගන්තිය යටතේ සහකාර මැතිවරණ නිලධාරීන් වශයෙන් 1973 ඔක්තෝබර මස 15 වැනි දින සිට පත් කරන්නට යෙදුන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බල මණ්ඩල)

1973 සැප්තැම්බර් මස
කොළඹ 7.

| නම | දිස්ත්‍රික්කය |
|---|---|
| 1. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ආර්. අයි. සී. කුරුප්පු මහතා ... | කොළඹ |
| 2. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ බී. කුලතුංග මහතා ... | කුරුණෑගල |
| 3. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ඩබ්ලිව්. ඩී. එල්. පෙරේරා මහතා | නුවරඑළිය |
| 4. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ටී. කේ. දසනායක මහතා ... | මොණරාගල |

10-238—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

# අයවැය ලේඛණ

**අලව්ව සුළු නගර සභාව**

**1973 වර්ෂයේ II වැනි පරිපූරක අය-වැය ලේඛණය**

**1 වැනි කොටස—සාමාන්‍ය**

| | | |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (2) ආයතන වියදම්— | | |
| (ජේ) හදිසි වියදම් ... ... | 100 0 | |
| (එම්) අතිකාල දීමනා ... ... | 500 0 | |
| | | 600 0 |
| බී.—මංමාවත් :— | | |
| (2) නඩත්තුව ... ... | 2,000 0 | |
| | | 2,000 0 |
| එකතුව ... | | 2,600 0 |

**2 වැනි කොටස—විදුලිය**

| | | |
|---|---|---|
| (3) පාලනය හා සාමාන්‍ය වියදම් :— | | |
| (ජේ) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ හා ප්‍රචාරක වියදම් ... | 350 0 | |
| | | 350 0 |
| | | 350 0 |

ඉහත සඳහන් 1970 වර්ෂයේ 2 වන පරිපූරක අය-වැය ලේඛණය 1973.07.25 වැනි දින පැවැති මාසික රැස්වීමේදී අංක 7 දරණ යෝජනාවෙන් සභා සම්මත කර ගන්නා ලදී.

එච්. ඇම්. කුමාරදස,
සභාපති,
අලව්ව සුළු නගර සභාව.
මගේ අංකය: 3/55/5

1973 අගෝස්තු මස 22 වැනි දින,
අලව්ව සුළු නගර සභා කාර්යාලයේ දී ය.

අනුමත කරන ලදී.

එච්. ඇම්. එච්. බංඩා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කුරුණෑගල.

1973 සැප්තැම්බර් මස 28 වැනි දින,
කුරුණෑගල, පළාත් පාලන කාර්යාලයේ දී ය.

10-313—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

## මොරටු නගර සභාව

### අයවැය ලේඛනය—1972

### පරිපූරක වැය ලේඛන අංක 2—1972

| වැය ශීර්ෂය | | අංක 1—සාමාන්‍ය අංශය මුදල රු. ශ. | | බලය යෝජනා අංක හා දින |
|---|---|---|---|---|
| ඒ.—1 (ඒ) | ලේකම් | 300 | 0 | 17 හා 72.12.9 |
| ඒ.—1 (බී) | ලිපිකරුවන් හා ආදායම් පරීක්ෂකයින් | 23,000 | 0 | 17 හා 72.12.9 |
| ඒ.—1 (සී) | වැටුප් පියන්වරු | 1,850 | 0 | 12 හා 72.5.13 |
| ඒ.—2 (ඒ) | දීමනා | 500 | 0 | 17 හා 72.12.9 |
| ඒ.—2 (බී) | ගමන් ගාස්තු | 2,200 | 0 | 17 හා 72.12.9 |
| ඒ.—2 (එෆ්) | ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ වැඩ හා කාර්යාලීය වියදම් | 15,000 | 0 | 11 හා 72.11.11 |
| ඒ.—2 (එෆ්) | ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ වැඩ හා කාර්යාලීය වියදම් | 5,000 | 0 | 19 හා 72.8.19 |
| ඒ.—2 (ඊ) | නීතිඥ ගාස්තු කටයුතු පිළිබඳ වියදම් | 315 | 0 | 8 හා 72.11.27 |
| ඒ.—2 (ජේ) | නිවාඩු දුම්රිය ප්‍රවේශ ගාස්තු | 100 | 0 | 5 හා 72.12.22 |
| ඒ.—2 (ඊ) | නීතිඥ කටයුතු පිළිබඳ වියදම් | 400 | 0 | 5 හා 72.12.22 |
| ඒ.—3 | ආපසු ගෙවීම් | 35 | 0 | 69 හා 72.4.8 |
| ඒ.—3 | යන්ත්‍ර හා ආයුධ | 10,000 | 0 | 5බී හා 72.12.22 |
| බී.—3 | යන්ත්‍ර හා ආයුධ | 3,000 | 0 | 11 හා 72.11.11 |
| බී.—3 | යන්ත්‍ර හා ආයුධ | 4,000 | 0 | 17 හා 72.12.9 |
| බී.—4 (බී) | විදුලි බුබුලු මිළයට ගැනීම | 4,800 | 0 | 5 හා 72.12.22 |
| බී.—4 (සී) | පහන් සවිකරණ උපකරණ මිලයට ගැනීම | 3,025 | 0 | 20 හා 72.5.13 |
| බී.—7 | අත්කර ගැනීම් | 8,500 | 0 | 11 හා 72.11.11 |
| බී.—7 | අත්කර ගැනීම් | 3,000 | 0 | 51 හා 72.7.8 |
| සී.—3 | ලී බඩු හා උපකරණ | 600 | 0 | 5බී හා 72.12.22 |
| සී.—3 | ලී බඩු හා උපකරණ | 200 | 0 | 17 හා 72.12.9 |
| ඩී.—5 | ලී බඩු | 5,000 | 0 | 5බී හා 72.12.22 |
| ඩී.—7 | නව කර්මාන්ත | 11,000 | 0 | 43 හා 72.6.10 |
| ඩී.—7 | නව කර්මාන්ත | 1,000 | 0 | 11 හා 72.1.11 |
| ඊ.—1 (ඒ) | වේතන | 1,000 | 0 | 17 හා 72.12.9 |
| ඊ.—1 (සී) | නිළ ඇඳුම් | 1,600 | 0 | 5 හා 72.12.22 |
| ඊ.—5 (ජේ) | ජලය මිළයට ගැනීම | 57,000 | 0 | 17 හා 72.12.9 |
| ඊ.—6 (ඩී) | නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා වේතන | 1,000 | 0 | 17 හා 72.12.9 |
| ඊ.—6 (ඩී) | නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා වේතන | 900 | 0 | 5 හා 72.12.22 |
| එෆ්.—1 | වේතන | 200 | 0 | 17 හා 72.12.9 |
| එෆ්.—1 | වේතන | 1,425 | 0 | 5 හා 72.12.22 |
| එෆ්.—4 | අත්කර ගැනීම් | 6,850 | 0 | 28 හා 72.6.10 |
| ඊ.—7 (අයි) | ඉරිදා පොල | 1,100 | 0 | 23 හා 72.7.8 |
| | | 1,73,900 | 0 | |

### II කොටස—විදුලිය අංශය

| වැය ශීර්ෂය | | මුදල රු. ශ. | | බලය යෝජනා අංකය හා දිනය |
|---|---|---|---|---|
| 2 (සී) | මීටර් ස්විච් යතුරු සහ වෙනත් උපකරණ | 1,900 | 0 | 5 හා 72.12.22 |
| 4 (ඒ) | වේතන ආදිය (විදුලි කාර්මිකයන් හා ලිපිකරුවන්) | 2,500 | 0 | 5 හා 72.12.22 |
| 4 (බී) | වේතන ආදිය (බාහිර කාර්‍ය මණ්ඩලය) | 19,500 | 0 | 5 හා 72.12.22 |
| 4 (සී) | මුද්‍රණ වැඩ සහ ලිපි ද්‍රව්‍ය | 5,000 | 0 | 5 හා 72.12.22 |
| 9 | විවාහ දීමනා | 300 | 0 | 5 හා 72.12.22 |
| | | 29,200 | 0 | |

ජයසුමන ධර්මබන්ධු,
සභාපති,
මොරටුව නගර සභාව.

1972 දෙසැම්බර් මස 30 වැනි දින,
මොරටුව නගර සභා කාර්යාලයේ දී ය.

10–323—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## නාවලපිටිය විශේෂ කොමසාරිස් කාර්‍යාලය

### 1973 වර්ෂයේ II වැනි පරිපූරක අය වැය ලේඛණය

### 1 වැනි කොටස—සාමාන්‍ය

| | රු. | ශ. | |
|---|---|---|---|
| ඊ.—2 (බී) | 2,000 | 0 | යෝජනා අංක 142 හා 73.09.24 වැනි දින |
| ඊ.—3 (බී) | 2,000 | 0 | එම |
| ඊ.—5 (සී) | 2,000 | 0 | එම |
| එකතුව | 6,000 | 0 | |

II වෙනි කොටස—විදුලිය

| | රු. | ශ. | |
|---|---|---|---|
| 3 (බී) විවාහක දීමනා ... ... | 500 | 0 | ... යෝජනා අංක 126 හා 73.08.16 වැනි දින |
| 3 (ඊ) ගමන් වියදම් ... ... ... | 400 | 0 | ... එම |
| 4 (බී) විවාහ දීමනා ... ... ... | 200 | 0 | ... එම |
| 4 (ඩී) අනතුරු දීමනා ... ... | 200 | 0 | ... එම |
| එකතුව ... | 1,300 | 0 | |

ඩබ්ලිව්. ඒ. ඊ. පීරිස්,
නාවලපිටිය නගරයේ විශේෂ කොමසාරිස්.

1973 සැප්තැම්බර් මස 24 දින,
නාවලපිටිය,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දිය.

10–322/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

නාවලපිටිය විශේෂ කොමසාරිස් කාර්‍යාලය

1973 අය වැය ලේඛනය

නගර සභා මුදල් රෙගුලාසි අංක 12 (II) යටතේ වැය මාරුකිරීම

1973 අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන්කරන ලද මුදල් වලින් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත දක්වෙන ශීර්ෂයන් යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකොට අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට මවිසින් තීරණය කරන ලදී.

| මුදල් ඉතිරිවන වැය ශීර්ෂය | රු. | ශ. | මුදල් අවශ්‍ය වන වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඩී.—(5) ලී බඩු ... ... ... | 10,000 | 0 | ඒ.—2 (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ වැඩ දැන්වීම් පළකිරීම් ... | 8,500 | 0 |
| ඇෆ්.—(4) අයත්කරගැනීම් ... ... | 500 | 0 | ඒ.—2 (ඇල්) අතිකාල දීමනා ... ... | 500 | 0 |
| ඒ.—2 (ඒ) දීමනා ... ... ... | 500 | 0 | ඒ.—2 (ජේ) නි. දූ. බලපත්‍ර ... ... | 1,000 | 0 |
| බී.—(2) නඩත්තු කිරීම් ... ... | 2,370 | 0 | ඒ.—2 (ඇන්) අතුරු දීමනා ... ... | 1,150 | 0 |
| ඇෆ්.—(2) නඩත්තු කිරීම ... ... | 1,500 | 0 | ඊ.—1 (බී) දීමනා ... ... ... | 900 | 0 |
| | | | ඊ.—1 (ජී) කාණු සෑදීම ... ... | 1,320 | 0 |
| | | | ඒ.—2 (බී) ගමන් වියදම් ... ... | 1,500 | 0 |
| | 14,870 | 0 | | 14,870 | 0 |

ඩබ්ලිව්. ඒ. ඊ. පීරිස්,
විශේෂ කොමසාරිස්,
නාවලපිටිය නගරය.

1973.09.24 දින,
නාවලපිටිය නගරයේ, විශේෂ කොමසාරිස් කාර්‍යාලයේදිය.

10–322/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

කළුතර නගර සභාව

මු.රෙ. 12 (2) යටතේ කෙරෙන අයදුම් පත

1973 වර්ෂයේ අයවැය ලේඛණයේ පහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල්, ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර, අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා යෙදවීමට මා විසින් 1973.09.18 දින අංක 117 දරණ නියෝගයෙන් සම්මත කරන ලදී.

සාමාන්‍ය අංශය

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | රු. | ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| බී.—(7) මහා මාර්ග සතුකොට ගැනීම් ... ... | 5,000 | 0 | ඒ.—(1) (ඊ) විශ්‍රාම වැටුප් ... ... | 20,000 | 0 |
| බී.—(8) මහා මාර්ග සංස්කරණය ... ... | 10,000 | 0 | ඒ.—(2) (එෆ්) ලිපි ද්‍රව්‍ය ... ... | 4,675 | 0 |
| බී.—(12) මහා මාර්ග අළුත් වැඩ ... ... | 15,000 | 0 | ඩී.—(1) (සී) විවාහක දීමනා ... ... | 700 | 0 |
| | | | ඩී.—(4) (සී) නගර සභා ගොඩනැගිලි නඩත්තු කිරීම (අනෙක්) | 500 | 0 |
| | | | ඊ.—(1) (සී) නිල ඇඳුම් ... ... ... | 50 | 0 |
| | | | ඊ.—(7) (අයි) නිළ ඇඳුම් ... ... ... | 75 | 0 |
| | | | එෆ්.—(1) මහජන විනෝදය—වේතන ... ... | 4,000 | 0 |
| | 30,000 | 0 | | 30,000 | 0 |

විදුලිය අංශය

| | රු. | ශ. | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| 6.—(ඒ) (1) නව සේවා පිරිද්දුම් ... ... | 2,000 | 0 | (3) (සී) අතිකාල දීමනා ... ... ... | 250 | 0 |
| | | | (3) (ජේ) ලිපි ද්‍රව්‍ය ... ... ... | 1,000 | 0 |
| | | | (3) (කේ) බැංකු ගාස්තු ... ... ... | 600 | 0 |
| | | | (4) (සී) අතිකාල දීමනා ... ... ... | 150 | 0 |
| | 2,000 | 0 | | 2,000 | 0 |

එල්. ජී. ඊ. වික්‍රමසේකර,
බලයලත් නිළධාරී,
කළුතර නගර සභාව.

1973 සැප්තැම්බර් මස 21 වැනි දින,
කළුතර න ගර සභා කාර්යාලයේ දීය.

10–320—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

**මීරිගම සුළු නගර සභාව**

**1973 අය වැය ලේඛණය**

**සුළු නගර සභා මු.රෙ. 40 (II) යටතේ අයදුම් පත**

1973 අය වැය ලේඛණයේ පහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ වෙන් කරණ ලද මුදල්වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද, ඊට අනුරූපව දක්වා ඇති වැය ශීර්ෂයන්ට සුළු නගර සභා මු.රෙ. 40 (II) යටතේ මාරු කර ඒ ඒ ශීර්ෂයන්ට අවශ්‍යවී ඇති අතිරේක වැය ප්‍රතිපාදනයන් පියවා ගැනීමට 1973 අගෝස්තු 31 වෙනි දින අංක 7 (7) යෝජනාවෙන් අනුමත කරණ ලදී.

I කොටස—සාමාන්‍ය

| ඉතිරි මුදල් වැය ශීර්ෂය | රු. ශ. | අමතර මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—1(බි) ලිපිකරුවන් ... ... | 4,000 0 | ඒ.—1 (එෆ්) විශ්‍රාම වැටුප් ... ... | 250 0 |
| ඒ.—2 (සි) කොමිස් ... ... | 1,000 0 | ඒ.—2 (ඒ) ආධාර ... ... ... | 70 0 |
| සී.—(4) නඩත්තු කිරීම ... ... | 4,370 0 | ඩී.—1 (ඒ) වැටුප් ... ... ... | 50 0 |
| | | ඩී.—1 (එෆ්) විෂනාශක ද්‍රව්‍ය ... ... | 1,000 0 |
| | | ඩී.—2 (ඒ) වේතන ... ... ... | 2,500 0 |
| | | ඩී.—3 (ඒ) වේතන ... ... ... | 1,500 0 |
| | | ඩී.—3 (ජී) ඉදිකිරීම ... ... ... | 4,000 0 |
| | 9,370 0 | | 9,370 0 |

II කොටස—විදුලිය

| | | | |
|---|---|---|---|
| ඊඇල්.—5 (ඒ) ගොඩනැගිලි ... ... | 3,000 0 | ඊඩී.—6 (ඒ) (1) සේවා පිරිවැද්දුම් ... ... | 8,000 0 |
| 16. දීර්ඝ කිරීම ... ... | 5,000 0 | ඊඩී.—3 (ඊ) ගමන් ගාස්තු ... ... | 25 0 |
| ඊඇල්.—5 (සී) වාහන ... ... | 25 0 | | |
| | 8,025 0 | | 8,025 0 |

ජේ. ඊ. අමරතුංග,
සභාපති,
මීරිගම සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 27 වැනි දින,
මීරිගම සුළු නගර සභා කාර්යාලයේ දීය.

10–317/1—73.10.12. දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

**මීරිගම සුළු නගර සභාව**

**1973 අය වැය ලේඛණය**

**වරද නිවැරදි කිරීමයි**

ශ්‍රී ලංකා ජන රජයේ අංක 36 හා 72.12.01 දින දරණ ගැසට් පත්‍රයේ (IV වැනි කොටසේ) පළකරන ලද මීරිගම සුළු නගර සභාවේ 1973 අය වැය ලේඛණයේ පළමුවැනි කොටසේ සාමාන්‍ය ආදයම් ශීර්ෂය යටතේ,

"ඩී.—සනීපාරක්ෂාව :—

(2) කසල ශෝධනය : රු. ශ.

(ඒ) ගාස්තු ... ... 2,600 0"

වැරදීමකින් පළකර ඇති ආදයම් ශීර්ෂය මින් ඉවත්කොට 1973 අය වැය ලේඛණය සංශෝධනය විය යුතු බව මින් දන්වමි.

ජේ. ඊ. අමරතුංග,
සභාපති,
මීරිගම සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 27 වැනි දින,
මීරිගම සුළු නගර සභා කාර්යාලයේ දීය.

10–317/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

**මු.රෙ. 40 (II) යටතේ කෙරෙන ඉල්ලීම—1973 අයවැය ලේඛණය**

| මුදල් ඉතිරිවේයැයි ගණන් බලන ලද වැය ශීර්ෂය | රු. ශ. | අතිරේක මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—(2) (ජේ) අනියම් වියදම් ... ... | 1,860 0 | ඒ.—(1) (එෆ්) විශ්‍රාම වැටුප් ... ... | 1,600 0 |
| ඩී.—(2) (ඒ) කසල ශෝධනය ... ... | 1,500 0 | ඒ.—(1) (ජී) විවාහක දීමනා ... ... | 160 0 |
| | | ඒ.—(2) (සී) අයකැමි කම්වු මිළ ... ... | 700 0 |
| | | ඒ.—(2) (ඇෆ්) ලිපි ද්‍රව්‍ය ... ... ... | 500 0 |
| | | බී.—(13) විවාහක දීමනා ... ... ... | 100 0 |
| | | ඩී.—(2) (ඊ) විවාහක දීමනා ... ... | 100 0 |
| | | ඩී.—(3) (බී) කරත්ත, ගොනුන් හා ලොරි ... ... | 200 0 |
| | 3,360 0 | | 3,360 0 |

1973 වර්ෂයේ අයවැය ලේඛණයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරිවේයැයි ගණන් බලන ලද ඉහත දක්වෙන වැය ශීර්ෂ යටතේ දක්වෙන මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා යෙදීමට 1973 සැප්තැම්බර් 27 වැනි දින පවත්වන ලද රැස්වීමේ අංක 10(3) දරණ යෝජනාව යටතේ සභා සම්මත විය.

විල්ප්‍රඩ් සේනානායක,
හෝමාගම සුළු නගර සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 1 වැනි දින,
හෝමාගම සුළුනගර සභා කායර්‍යාලයේ දීය.

10–433—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

කන්තලේ සුළු නගර සභාව

1973 වර්ෂයේ දෙවැනි පරිපූරක අය-වැය ලේඛණය

මූ.රෙ. 40 (I) යටතේ 1 වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂ | | මුදල රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය :— | | |
| (2) සංස්ථා වියදම්— | | |
| (එෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ වැඩ හා දැන්වීම | ... | 500 0 |
| ඒ.—සාමාන්‍ය :— | | |
| (2) සංස්ථා වියදම්— | | |
| (ඇම්) අතිකාල දීමනා ... | ... | 800 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (2) නඩත්තු කිරීම ... ... | ... | 2,000 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (4) වීදි ආලෝක කිරීම ... | ... | 1,600 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (7) අත්පත්කර ගැනීම් ... | ... | 500 0 |
| ඩී.—සනීපාරක්ෂාව :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (එෆ්) විශබීජ නාශක ද්‍රව්‍ය ... | ... | 100 0 |
| | | 5,500 0 |

කන්තලේ සුළු නගර සභාවේ, 1973 ජූලි 31 වැනි දින රැස්වීමේ 7 (1) යෝජනාවෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ අනුමතියට යටත්ව මුදල් ප්‍රතිපාදනය කොට වියදම් කිරීමට සභා සම්මත විය.

කේ. ජී. ප්‍රේමදාස,
සභාපති,
කන්තලේ සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
කන්තලේ,
1973.9.10.

අනුමත කරමි.

බී. ඒ. ජේ. කාසිනාදර්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ත්‍රිකුණාමලය.

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
1973.9.28.

10-458—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

කවුඩන් නාව නගර සභාව

1973 වර්ෂය

1 වෙනි පරිපූරක ඇස් තමේන් තුව

සාමාන්‍ය අංශය

| වැය ශීර්ෂය | | මුදල රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය :— | | |
| ඊ. විශ්‍රාම වැටුප් ... | ... | 4,500 0 |

1973. 07. 24 දින පවත්වන ලද රැස්වීමේ අංක 10 දරණ යෝජනා වෙන් සභා සම්මත විය.

ජෝර්ජ් ගුණසේකර,
සභාපති,
නගර සභාව, කවුඩන් නාව.

නගර සභා කාර්යාලය,
කවුඩන් නාව, 1973. 08. 22 දින.

අනුමත කරමි.

ආර්. බී. සමරකෝන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්.

මහනුවර,
1973. 09. 28 දින.

10-438—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

වතුගෙදර සුළු නගර සභාව

1973 වර්ෂයේ 1 වැනි පරිපූරක වැය ලේඛනය

1 වැනි කොටස—සාමාන්‍ය

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම :— | | | | |
| (2) සංස්ථා වියදම් : | | | | |
| (එෆ්) ලිපිද්‍රව්‍ය මුද්‍රණ ප්‍රකාශන හා තැපැල් ගාස්තු මුද්දර | | ... | ... | 2,000 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | | | |
| (7) නව කර්මාන්ත | ... | ... | ... | 4,500 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | | | |
| (5) ජල සම්පාදනය :— | | | | |
| (සී) නඩත්තු කිරීම | ... | ... | ... | 400 0 |
| (7) වෙළඳපොලවල් හා ගාල් :— | | | | |
| (බී) නඩත්තු කිරීම | ... | ... | ... | 90 0 |
| එෆ්.—සොහොන් බිම් :— | | | | |
| (2) නඩත්තු කිරීම | | | ... | 6,000 0 |
| | | | | 12,990 0 |

වර්ෂ 1973 මැයි මස 28 වන දින පවත්වන ලද සභා වාරයේ අංක 15.
වර්ෂ 1973 ජූලි මස 30 වන දින පවත්වන ලද සභා වාරයේ අංක 18.
වර්ෂ 1973 අගෝස්තු මස 31 වන දින පවත්වන ලද සභා වාරයේ අංක 9 දරණ යෝජනා අනුව සම්මත කරගන්නා ලදී.

ආර්. සී. ද සිල්වා,
සභාපති,
වතුගෙදර සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 25 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය,
වතුගෙදර.

10-408/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

### වතුගෙදර සුළු නගර සභාව

1973 වර්ෂයේ අය වැය ලේඛනය

**සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (11) යටතේ වූ අයදුම් පත්‍රයයි**

1973 අය වැය ලේඛනයේ පහත සඳහන් වැය ශීර්ෂය යටතේ වෙන්කර ඇති මුදල්වලින් වර්ෂය අවසානයේ ඉතුරුවේයයි ගණන් බලන ලද පහත සඳහන් උප වැය ශීර්ෂ යටතේ වූ මුදල්, මුදල් අවශ්‍යවේයයි ගණන් බලා ඇති අවශ්‍ය උප ශීර්ෂයනට මාරු කිරීමට තීරණය කරමි.

විදුලි අංශය

| මුදල් ඉතුරුවේයයි ගණන් බලා ඇති ශීර්ෂය | රු. | ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| 2 වන කොටස—ප්‍රාග්ධන | | | 1 වන කොටස—පුනරාවර්තන වියදම් | | |
| 8.—ණය මුදල් ආපසු ගෙවීම් ... ... | 3,505 | 0 | 3.—පාලනය සහ සාමාන්‍ය වියදම්— (එන්) ණය සඳහා පොලී ... ... | 3,505 | 0 |
| | 3,505 | 0 | | 3,505 | 0 |

වර්ෂ 1973 ජූලි මස 30 වන දින සභාවේ අංක 24 දරණ යෝජනාව අනුව සම්මත කරණ ලදී.

ඇල්. සී. ද සිල්වා,
සභාපති,
වතුගෙදර සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 25 වැනි දින,
සුළු නගර සභා කායාලය,
වතුගෙදර.

10–408/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

### හික්කඩුව සුළු නගර සභාව

1973 වර්ෂයේ 2 වැනි පරිපූරක වැය ලේඛනය

**1 වැනි කොවස—සාමාන්‍ය**

| වැය ශීර්ෂය | | රු. | ශ. |
|---|---|---|---|
| ඒං—සාමාන්‍ය වියදම් : | | | |
| ඒ.—1 (බී) | ලිපිකරු වැටුප් ... ... | 100 | 0 |
| ඒ.—2 (බී) | ගමන් ගාස්තු ... ... | 800 | 0 |
| ඒ.—2 (එෆ්) | ලිපි ද්‍රව්‍ය ... ... ... | 1,000 | 0 |
| ඒ.—2 (ජී) | වාහන තහඩු ... ... ... | 40 | 0 |
| බී.—2 | මාර්ග නඩත්තු කිරීම ... ... | 900 | 0 |
| බී.—3 | මාර්ග උපකරණ ... ... | 250 | 0 |
| බී.—12 | නව කර්මාන්ත ... ... | 1,000 | 0 |
| බී.—7 | නව කර්මාන්ත ... ... | 7,500 | 0 |
| ඩී.—1 (එෆ්) | විෂ නාශක ... ... ... | 100 | 0 |
| ඩී.—1 (ජී) | සෞඛ්‍ය උපකරණ ... ... | 150 | 0 |
| සී.—1 (එච්) | කාණු ඉදිකිරීම ... ... | 2,000 | 0 |
| ඩී.—1 (එල්) | බරවා රෝග ... ... ... | 150 | 0 |
| ඩී.—1 (එන්) | මාතෘදකාභිවෘධි මධ්‍යස්ථාන ... ... | 200 | 0 |
| ඩී.—2 (සී) | උපකරණ හා ගබඩා ... ... | 100 | 0 |
| ඩී.—3 (බී) | කරත්ත ... ... ... | 250 | 0 |
| ඩී.—3 (සී) | උපකරණ හා ගබඩා ... ... | 250 | 0 |
| ඩී.—6 (බී) | බෙහෙත් ද්‍රව්‍ය ... ... | 1,000 | 0 |
| ඩී.—6 (ඩී) | විවාහ දීමනා ... ... ... | 50 | 0 |
| ඊ.—2 | මහජන විනෝදය—නඩත්තුව ... ... | 4,000 | 0 |
| ජේ.—3 | පොත්පත් සහරා ... ... | 1,500 | 0 |
| | | 21,340 | 0 |

**2 වැනි කොටස—විදුලිය දෙපාර්තමේන්තුව**

| | | රු. | ශ. |
|---|---|---|---|
| විදු.—1 (ඒ) | විදුලිය ගාස්තු... ... ... | 3,000 | 0 |
| විදු.—3 (ඊ) | ගමන් ගාස්තු ... ... | 300 | 0 |
| විදු.—4 (ඒ) | වැටුප් හා වේතන ... ... | 300 | 0 |
| විදු.—7 (ඩී) | ලී බඩු සහ කාර්යාල උපකරණ ... | 500 | 0 |
| විදු.—15 | වීථි ආලෝක කිරීම ... ... | 1,200 | 0 |
| | | 5,300 | 0 |

1973 අගෝස්තු මස 31 වැනි දින පැවැත්වූ හික්කඩුව සුළු නගර සභාවේ මාසික රැස්වීමේ දී අංක 5 (IV) දරණ යෝජනා ස්ථිරත්වය අනුව 1973 වර්ෂයේ 2 වැනි පරිපූරක වැය ලේඛනය ඉහත සඳහන් අන්දමට සම්මත කර ගන්නා ලදී.

ඇස්. කේ. නන්දිසේන,
සභාපති,
හික්කඩුව සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 18 වැනි දින,
හික්කඩුව සුළු නගර සභා කාර්යාලයේ දී ය.

10–470—73.10.12 දින අංක 81 දරණ ගසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

### රත්නපුර මහ නගර සභාව

1974 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සංශෝධිත ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 477 වන අධිකාරයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත**

රත්නපුර මහ නගර සභාව විසින් සංශෝධිත, ලංකා ප්‍රඥප්ති සංග්‍රහයේ 477 වන අධිකාරයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර, රත්නපුර මහ නගර සභා පාලන සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකුට රු. 2ක හා සෑම බැල්ලියකට රු. 2.50ක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1974 වර්ෂයට පනවා ඇති බවත්, එකී ගාස්තු 1974 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ෂෙල්ටන් කොස්වත්ත,
නාගරික කොමසාරිස්, රත්නපුර.

1973 සැප්තැම්බර් මස 27 වැනි දින,
රත්නපුර, මහ නගර සභා කාර්යාලයේ දීය.

10–312/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

## රත්නපුර මහ නගර සභාව

### 1974 වර්ෂය සඳහා වාහන හා සතුන් බද්ද

රත්නපුර මහ නගර සභාව විසින්, (1) මහ නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) අංක 245 (1) දරණ වගන්තිය යටතේ 1974 වර්ෂයට වාහන හා සතුන් වෙනුවෙන් පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් කර ඇති බද්ද පනවා ඇති බවත්,

(2) එම ආඥාපනතේ අංක 245 (2) දරණ උප වගන්තිය යටතේ මෙම බදු මුදල් 1974 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ෂෙල්ටන් කොස්වත්ත,
නාගරික කොමසාරිස්,
රත්නපුර මහ නගර සභාව.

1973 සැප්තැම්බර් මස 27 දින,
රත්නපුර මහ නගර සභා කාර්යාලයේ දීය.

### උපලේඛනය

| | රු. | ශ |
|---|---|---|
| මෝටර් කාර, රෝද තුනේ මෝටර් රියක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ රෝද තුනේ බයිසිකලයක් හැර අන් ඕනෑම වාහනයක් ... ... ... | 5 | 00 |
| සෑම බයිසිකලයක්, ට්‍රයිසිකලයක්, බයිසිකල් කාරයක් හෝ ට්‍රයිසිකල් කාරයක් හෝ කරත්තයක් | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කිරීමේදී ... | 5 | 0 |
| (ආ) අන් අන් දමකට පාවිච්චි කිරීමේදී ... | 1 | 50 |
| සෑම කරත්තයකට ... ... | 3 | 0 |
| සෑම අත් කරත්තයකට ... ... | 5 | 0 |
| ජින් රික්ෂෝවකට ... ... | 2 | 0 |
| සෑම අශ්වයෙකු, අශ්වතරයෙකු හෝ කොටළුවෙකුට... | 2 | 50 |
| සෑම ගොනෙකු හෝ බූරුවෙකුට ... ... | 2 | 0 |

10–312/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## බණ්ඩාරවෙල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලය

### ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛණයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයෙහි 1973 වර්ෂයේ මස් වෙළඳාම කරගෙන යාම සඳහා බල පත්‍රයක් ඉල්ලමින් අයැදුම් පතක් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝ ඝාතක ආඥාපනතේ (272 වන පරිච්ඡෙදයේ) 7 (2) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත්කිරීම ගැන බණ්ඩාරවෙල නගර සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධවන්නේ කුමන කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

### උප ලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| සී. එච්. අබ්දුල් ලතීෆ් මයා, අංක 5, පූනාගල පාර නි. යෝ. ක්‍රමය, බණ්ඩාරවෙල ... | එළු මස් ... | අංක 23, ප්‍රසිද්ධ වෙළඳ සැල, බණ්ඩාරවෙල |

ආර්. සැන්ට්. ඇස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
බණ්ඩාරවෙල නගරය.

1973 සැප්තැම්බර් මස 27 දින,
බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–315—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතෙහි (272 වෙනි අධිකාරිය)

මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන තැනැත්තන් විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1974 ක් වූ ජනවාරි මස 01 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව අවිස්සාවේල්ල නගර සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14ක් ඇතුලත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වෙනි අධිකාරියේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

### උප ලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇස්. ඇම්. සෝමපාල, අංක 8, ධර්මපාල මාවත, අවිස්සාවේල්ල | හරක් මස් ... | අවිස්සාවේල්ල ජාතික පොලේ අංක 1 දරණ කඩ කාමරය |
| 2. | එම ... | හරක් මස් ... | අවිස්සාවේල්ල ජාතික පොලේ අංක 2 දරණ කඩ කාමරය |
| 3. | එම ... | හරක් මස් ... | අවිස්සාවේල්ල ජාතික පොලේ අංක 3 දරණ කඩ කාමරය |
| 4. | ඇම්. ජී. එච්. මොහිදීන්, උක්වත්ත, අවිස්සාවේල්ල ... | එළු මස් ... | අවිස්සාවේල්ල ජාතික පොලේ අංක 4 දරණ කඩ කාමරය |
| 5. | එම ... | එළු මස් ... | අවිස්සාවේල්ල ජාතික පොලේ අංක 5 දරණ කඩ කාමරය |
| 6. | ඇස්. ඇම්. සරත්, අංක 8, ධර්මපාල මාවත, අවිස්සාවේල්ල ... | ඌරු මස් ... | අවිස්සාවේල්ල ජාතික පොලේ අංක 6 දරණ කඩ කාමරය |
| 7. | ඇම්. ජී. එච්. මොහිදීන්, උක්වත්ත, අවිස්සාවේල්ල ... | හරක් මස් ... | පුවක්පිටිය පොදු වෙළඳ පොලේ පිහිටි හරක් මස්කඩය |

ආර්. එල්. ජී. එස්. ඇලෝසියෙස්,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
අවිස්සාවේල්ල, 1973 ඔක්තෝබර් මස 01 දින.

10–399—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කය—බෙම්මුල්ල ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත නම් සඳහන් උපලේඛණයේ නම් සඳහන් අය විසින් මෙහි දැක්වෙන ස්ථානයේ 1974 වර්ෂයට එළ හරක් මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලා ඇති බැවින් මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ බෙම්මුල්ල ගම් සභා සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුක්තව සකස්කර දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 30ක් ඇතුලත මාවෙත ලැබෙන්න සැලැස්විය යුතු බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 272 වැනි පරිච්ඡෙදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| කේ. ඇම්. රෂිදු මයා., නො. 32, ජයන්තා පාර, ගම්පහ ... | බෙම්මුල්ල පොදු වෙළඳ පොල ... | එළහරක් මස් කඩය |

මෙයට,
ග. දයානන්ද සිල්වා,
පරිපාලන නිලධාරි,
බෙම්මුල්ල ගම් සභාව.

1973 ඔක්තෝබර් 1 දින,
බෙම්මුල්ල ගම් සභාව,
වටද්දර, වේයන්ගොඩ.

10–419 —73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## කැකිරාව සුළු නගර සභාව

### 1974 වර්ෂයට සුනඛයින් ලියා පදිංචි කිරීමේ ගාස්තු

### (477 වැනි අධිකාරය වන) සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනත

477 වන අධිකාරය වන සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර, කැකිරාව සුළු නගර සභා පාලන සීමාව තුළ තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රු. 1 බැගින් ගැණු සුනඛයෙක් සඳහා රු. 2 බැගින් ද වූ ගාස්තුවක් 1974 මාර්තු මස 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් පසුගිය වර්ෂය තුළ දී බල පැවැත් වූ ආකාරයටම 1974 වර්ෂයට ද අය කිරීමට පනවා ඇති බව තත් නගර සභාවේ පාලන නිලධාරි, එස්. එන්. බී. ඩබ්. එම්. මන්ත්‍රීපාල වන මා විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එස්. එන්. බී. ඩබ්. එම්. මන්ත්‍රීපාල,
පාලන නිලධාරි,
කැකිරාව සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 21 දින,
කැකිරාව සුළු නගර සභා කාර්යාලයේ දීය.

10–434/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## කැකිරාව සුළු නගර සභාව

### 1974 වර්ෂයට සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### (256 වැනි අධිකාරය වූ) සුළු නගර සභා ආඥාපනත

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උප ලේඛනයේ විස්තර වන ගණන් අනුව පසුගිය වර්ෂය තුළ දී බල පැවැත් වූ ආකාරයටම 1974 වර්ෂයට ද රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටත්,

2. එකී ආඥාපනතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1974 වර්ෂයේ මාර්තු 31 වෙනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද, කැකිරාව සුළු නගර සභාවේ පාලන නිලධාරි, එස්. එන්. බී. ඩබ්ලිව්. එම්. මන්ත්‍රීපාල වන මා විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

| උපලේඛනය | රු. ශත |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර්කාර්, ලොරි, මෝටර් පා පැදි, කරත්ත අත් කරත්ත, ජින් රික්ෂෝ, රථ, පා පැදි හා රෝද ත්‍රයේ පා පැදි හැර වෙන ඕනෑම අන් දමේ වාහනයක් සඳහා ... | 5 00 |
| සෑම පා පැදියක්, රෝදත්‍රයේ පා පැදියක් හෝ පා පැදි මෝටර් රථයක් හෝ කරත්තයක් | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 2 50 |
| (ආ) වෙළඳාම හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේනම් ... ... | 1 00 |
| ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | 4 50 |
| තනි ගොනා බැඳි සෑම බරකරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | 2 50 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 50 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා... | 5 00 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... | 1 00 |

එස්. එන්. බී. ඩබ්ලිව්. එම්. මන්ත්‍රීපාල,
පාලන නිලධාරි,
කැකිරාව සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 04 දින,
කැකිරාව සුළු නගර සභා කාර්යාලයේ දීය.

10–434—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## වේයන්ගොඩ සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වෙන අය විසින් මස් විකිණීම සඳහා 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව වේයන්ගොඩ සුළු නගර සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසායැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වන දිනයේ සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වෙනි අධිකාරය) අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඩබ්ලිව්. ලෙස්ලි සිල්වා, මීගමු පාර, නිට්ටඹුව ... | එළ හරක් මස් ... | වේයන්ගොඩ ප්‍රසිද්ධ වෙළඳපලේ අංක 1 මස් කඩය |
| 2. මෝහන් කරුණාරත්න, රවුම් පාර, පත්තලගෙදර ... | එළු මස් සහ කුකුල් මස් ... | වේයන්ගොඩ ප්‍රසිද්ධ වෙළඳපලේ අංක 2 මස් කඩය |
| 3. ඩබ්ලිව්. ඩී. ලයනල්, ශාන්ත අන්තෝනි මාවත, නිට්ටඹුව ... | ඌරු මස් ... | වේයන්ගොඩ ප්‍රසිද්ධ වෙළඳපලේ අංක 3 මස් කඩය |

ඒ. කේ. ආර්. පෙරේරා,
සභාපති,
වේයන්ගොඩ සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
වේයන්ගොඩ,
1973 ඔක්තෝබර් 1 වැනි දින.

10–327—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

උප ලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇස්. මොහම්මදු ලෙබ්බෙ, නැගම්, නැගම්පහ ... | ... එළහරක් මස් විකිණීම... | අංක 16, කම්මල්වත්ත, මොරගොල්ලාගම |

මිත්‍රරත්න දසනායක,
මොරගොල්ලාගම ගම්සභාවේ සභාපති,

1973 සැප්තැම්බර් 28 දින,
ගම්සභා කාර්යාලය,
මොරගොල්ලාගම.

10–314—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

**වර්ෂ 1973 ජූනි මස 30 වැනි දින සභා රැස්වීමේ 7 වැනි කාණ්ඩය— මං මාවත් හා පාරවල්**

ගම්සභා ආඥාපනතේ 257 වැනි අධිකාරයේ 42 වැනි වගන්තියේ ප්‍රකාර 1952 අංක දරණ ප්‍රදේශාධිකාරී සභා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය ගිරිතලේ ගම්සභාව විසින් සම්පාදනය කළාක් මෙන් පිළි ගැනීම සහ IV වැනි කාණ්ඩයේ එකී උප වගන්තිය යටතේ මෙහි පහත උප ලේඛනයේ සඳහන් මං මාවත් එකී ඉදිරියෙන් ඇති දිග පළල අනුව මෙම ගම්සභාව විසින් සාද හෝ නැවත සාද හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ ගිරිතලේ ගම්සභාව විසින් පාලනය කරගෙන යාම කළ යුතු යයි ඇන්. පී. පියදස මහතා විසින් කරන ලද යෝජනාව ටී. ඇම්. ටිකිරි බංඩා මහතාගේ ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

උප ලේඛනය

| නි.කො. | අංකය | පාරේ නම | පාරේ දුර ප්‍රමාණය සැත. | පර්. |
|---|---|---|---|---|
| 1. | 1 | ඇල්. ඩී. ඕ. ඉඩම්වල ගම මැද පාර ... | — | 6 |
| 2. | | ගිරිතලේ ගම සුසාන භූමි පාර ... ... | 1 | — |
| 3. | 2 | බෝගහදමන පාර ... ... | 2 | 4 |
| 4. | | එම දෙවැනි කොටසේ පාර ... ... | 1 | — |
| 5. | | නිකවැව ශ්‍රමදන පාර ... ... | — | 4 |
| 6. | | පන්සල පාර ... ... ... | — | 4 |
| 7. | | විද්‍යාල පාර ... ... ... | — | 2 |
| 8. | | ජනපද ශ්‍රමදන පාර ... ... | — | 2 |
| 9. | | බෝගහදමන රජඇල පාර ... ... | 1 | 4 |
| 10. | | ප්‍රධාන පාර ... ... ... | 2 | — |
| 11. | | රජඇල ප්‍රධාන පාර ... ... | 2 | — |
| 12. | | රජ ඇල කොතලාවල පාර ... ... | 1 | 4 |
| 13. | 3 | ගිරිතලේ ජනපදයේ සිට නුගගහදමන හතමුණ පාර | — | 6 |
| 14. | | පලුගොල්ලාවල පාර ... ... | — | 4 |
| 15. | | එල්. ඩී. ඕ. අතුරු පාර අංක 1, 2, 3 ... | — | 6 |
| 16. | | සුසාන භූමි පාර ... ... | — | 1 |
| 17. | 4 | වැක් 1 ගුරු කුල විද්‍යාල පාර ... ... | 1 | 4 |
| 18. | | වැක් 12 සිට 1 දක්වා පාර ... ... | — | 4 |
| 19. | | වැක් 12 සිට 41 දක්වා පාර ... ... | — | 4 |
| 20. | | වැක් 14 සිට 16 දක්වා පාර ... ... | — | 2 |
| 21. | | 40 සිට 28 දක්වා පාර ... ... | — | 2 |
| 22. | | වැක් 2 සිට ගුරුකුල විද්‍යාල පාර ... ... | — | 2 |
| 23. | | 58 සිට 42 දක්වා පාර ... ... | — | 2 |
| 24. | | පාලම සිට වැක් 2 දක්වා පාර ... ... | — | 4 |
| 25. | | වැක් 3 සිට ගුරුකුල විද්‍යාල පාර ... ... | 2 | — |
| 26. | | 107 සිට ගුරුකුල විද්‍යාල පාර ... ... | 1 | — |
| 27. | | 108 සිට වැක් 2 දක්වා පාර ... ... | — | 4 |
| 28. | | 108 සිට වැක් 4 දක්වා පාර ... ... | 1 | — |
| 29. | | 108 සිට වැක් 14 දක්වා පාර ... ... | 1 | 4 |
| 30. | | 112 සිට වැක් 42 දක්වා පාර ... ... | — | 4 |
| 31. | | 133 සිට වෙල් පාර ... ... | — | 4 |
| 32. | 5 | වැක් 5 ප්‍රධාන පාර ... ... | 1 | 4 |
| 33. | | වැක් 2 පාසල් පාර ... ... | 1 | — |
| 34. | | ඇල්. බී. 1 පාර ... ... ... | 1 | — |
| 35. | | ප්‍රධාන ඇලට යාබද පාර ... ... | 1 | 4 |
| 36. | | ප්‍රධාන පාරට යාබද පාසල් ඉඩම් පාර ... | — | 6 |
| 37. | | තඹල වැව පාර ... ... | — | 4 |
| 38. | | වැක් 5 පාරට යාව ගම මැද පාර ... ... | — | 4 |
| 39. | 6 | වැක් 14/1 තඹල වැව පාර ... ... | 3 | 6 |
| 40. | | වැක් 14/2 අතුරු පාර ... ... | — | 4 |
| 41. | | වැක් 14/2 පාර ... ... ... | — | 4 |
| 42. | | වැක් 13/1 කොටසේ පාර ... ... | 1 | — |
| 43. | | වැක් 13/2 කොටසේ පාර ... ... | 1 | 4 |
| 44. | | ගෙවල් අටට යන පාර ... ... | — | 4 |
| 45. | | වැක් 12 ප්‍රධාන පාර ... ... | 2 | — |
| 46. | | වැක් 12 අංක 1, 2, 3, අතුරු පාර ... | 1 | 4 |
| 47. | | ගෙවල් 11 ට යන පාර ... ... | 1 | 4 |
| 48. | 7 | 6 ඇල පාර ... ... ... | — | 4 |
| 49. | | 7 ඇල 1 වැනි පාර ... ... | — | 2 |
| 50. | | 7 ඇල දෙවැනි පාර ... ... | — | 4 |
| 51. | | නාගපොකුණ සුසාන භූමි පාර ... | — | 6 |
| 52. | 8 | ලොට් 48 ගම මැද පාර ... ... | — | 6 |
| 53. | | වැක් 3 ගම මැද පාර ... ... | 3 | — |
| 54. | | 888 ඉඩම අසලින් ඇල් බී 2 පාර ... | — | 4 |
| 55. | | 248 ඉඩම අසලින් වැක් 8 මහ ඇල දක්වා පාර ... | — | 4 |
| 56. | | 248 අංක 1, 2, 3 අතුරු පාරවල් ... | 1 | 4 |
| 57. | | වැක් 7 අසලින් යන පාර ... ... | — | 4 |
| 58. | | වැක් 5 ඇල බැමි පාර ... ... | 1 | 4 |
| 59. | | උණගලාවෙහෙර සුසාන භූමි පාර ... | — | 4 |
| 60. | | නව නගරය හරහා ප්‍රජා මණ්ඩල පාර ... | — | 4 |
| 61. | 9 | වා. මා. ඇල අසලින් යන 23 පාර ... | 1 | 4 |
| 62. | | එම දෙවැනි පාර ... ... | — | 6 |
| 63. | | එල් බී 1 පාලම අසලින් යන පාර... ... | — | 4 |
| 64. | | චන්දනපොකුණ පාසල් පාර ... ... | 1 | — |
| 65. | | චන්දනපොකුණ දක්වා පාර ... ... | 2 | — |
| 66. | 10 | පන්සල පාර ... ... | — | 4 |
| 67. | | අංක 198 පාඨශාලා පාර ... ... | 1 | — |
| 68. | | ගෙවල් 11 දක්වා පාසල පාර ... ... | 1 | — |
| 69. | | පාඨශාලා රවුම් පාර ... ... | — | 4 |
| 70. | | අංක 210 සිට 238 දක්වා පාර ... ... | — | 2 |
| 71. | | ගෙවල් කට්ටි 10 යන පාර ... ... | — | 2 |
| 72. | | ආර්. බී. 22 ගෙවල් 10ට යන පාර ... | — | 2 |
| 73. | | ප්‍රධාන ප්‍රසිද්ධ පාසල් පාර ... | — | 2 |
| 74. | | විජිත හන්දියේ සිට 9 කණුව දක්වා පාර ... | 2 | — |
| 75. | | ආර්. බී. 22 ඇල පාර ... ... | 2 | 4 |
| 76. | 11 | ගල්අමුනේ සිට 19 දක්වා පාර ... ... | 2 | 6 |
| 77. | | එෆ්. සී. 13 සිට 8 දක්වා ගෙවල් වලට යන පාර ... | — | 6 |
| 78. | | ශ්‍රමදන පාරේ සිට ගෙවල් 11ට යන පාර ... | 1 | — |
| 79. | | එම ගෙවල් 7ට යන පාර ... | — | 6 |
| 80. | | එෆ් සී 13 සිට 106 දක්වා ගෙවල් වලට යන පාර ... | — | 4 |
| 81. | | ජයන්තිපුර සිට චන්දනපොකුණ දක්වා පාර ... | 4 | — |
| 84. | | චන්දනපොකුණ සිට බී ඕ පි 317 දක්වා පාර ... | 2 | — |

දෙවැනි උපලේඛනය

ඉහත සඳහන් පාරවල් සියල්ලම පළලින් අඩි දහසයක් (අඩි 16ක්) විය යුතු බවට 1973 සැප්තැම්බර් මස 22 වැනි දින සභා රැස්වීමේදී සම්මත වී ඇත.

සත්‍ය බවට,

පී. ආර්. පෙරමුණ,
ගිරිතලේ ගම්සභාවේ ප්‍රධාන තැන.

10—311—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

## මැදිරිගිරිය ගම්සභා පුස්තකාල අතුරු ව්‍යවස්ථා

මෙම අතුරු ව්‍යවස්ථා මැදිරිගිරිය ගම්සභාවේ පුස්තකාල අතුරු ව්‍යවස්ථා නමින් හැඳින්වේ.

1. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය නොවුවහොත් මේ අතුරු ව්‍යවස්ථාවල "පුස්තකාලයාධිපති" යන්නෙන් පුස්තකාලය භාරව සිටීම පිණිස සභාව විසින් පත් කරන තැනැත්තා අදහස් වන අතර, ඔහුගේ සහකරුවෝද එයට ඇතුළත් වෙති.

2. මැදිරිගිරිය ගම්සභාව මගින් පාලනය කරනු ලබන පුස්තකාලය පහත සඳහන් අංශයන්ගෙන් සමන්විත වේ.

(අ) පොත් බැහැරට දෙන පුස්තකාලයකින්,

(ආ) ආශ්‍රය පුස්තකාලයකින්,

(ඇ) කියවීම් ශාලාවකින්, සහ

(ඈ) පහත දැක්වෙන දෑ, එනම්—

(1) පුස්තකාලයේ ළමා අංශයක්,

(2) ප්‍රජා මණ්ඩලවලට හා ඒ හා සමාන අනුමත ප්‍රජා ව්‍යාපාරවලට තාවකාලිකව පොත් පාවිච්චියට දීම සහ

(3) පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව සභාව විසින් අනුමත කරන ලද වෙනත් යම් පුස්තකාල සේවයක්,

යන මේවා කවරකින් හෝ සමන්විත වන ව්‍යාප්ත පුස්තකාල සේවයකින් සමන්විත විය හැකිය.

3. (1) මහජන පුස්තකාලයේ පරිපාලනය හා සාමාන්‍ය පාලනය (මින් පසු මෙහි "කාරකසභාව" යනුවෙන් සඳහන් කරනු ලබන)—

(අ) සභාවේ එවකට සිටින සභාපති ගෙන්,

(ආ) සභාව විසින් තෝරා පත් කරනු ලබන හතර දෙනෙකුට වැඩි නොවූ සභාවේ වෙනත් සාමාජිකයින් ගණනකින් සහ

(ඇ) සභාව විසින් තෝරා ගනු ලබන සභාවේ පාලන සීමාව ඇතුළත පදිංචි ප්‍රසිද්ධ තැනැත්තන් පස් දෙනෙකුගෙන් ද, යුක්තව පුස්තකාල කාරක සභාවක් වෙත පැවරිය යුතුය.

(2) පුස්තකාලය භාරව සිටිය යුතු පුස්තකාලයාධිපතියෙකු සභාව විසින් පත් කල හැකි අතර ඒ පුස්තකාලය ඇතුළත මනා විනය පවත්වාගෙන යාම ගැන ඔහු වගකිව යුතුය.

(4) (1) සභාවේ සභාපති නිලබලයෙන් කාරක සභාවේ සභාපති විය යුතු අතර, කාරක සභාවේ සැම රැස්වීමකම මුලසුන ඔහු විසින් දැරිය යුතුය. කාරක සභාවේ යම් රැස්වීමකට සභාපති නොපැමිණි අවස්ථාවක, පැමිණ සිටින සෙසු සාමාජිකයින් විසින් ඒ කාර්යය සඳහා තෝරා ගනු ලබන සාමාජිකයෙකු ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතුය.

(2) යම් රැස්වීමක මුලසුන දරණ සාමාජිකයාට මුල් ඡන්දයක් ද, යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දෙන ලද ඡන්ද ගණන සමාන වුවහොත් තීරක ඡන්දයක් ද හිමිවිය යුතුය.

(5) සාමාජිකයින් පස් දෙනෙකුගේ සංඛ්‍යා පූරණයක් නොමැතිවුව හොත්, කාරක සභාවේ යම් රැස්වීමකදී කිසිම කටයුත්තක් නොකල යුතුය.

(6) (1) අවශ්‍යයැයි, කාරක සභා විසින් සලකනු ලබන යම් යම් කොන්දේසිවලට යටත් කොට මහජන පුස්තකාලයට අයත් ස්ථානයේ යම් කොටසක් පාවිච්චි කිරීම පිණිස කවර තැනැත්තෙකු වුවද අවසරදීමට හෝ පුස්තකාල පිළිබඳ මේ අතුරු ව්‍යවස්ථාවන් ගෙන් යම් කිසිවක් කඩ කර ඇති කවර තැනැත්තකුට හෝ ඒ ස්ථානයේ කවර කොටසක් වුව ද පාවිච්චි කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීමට කාරක සභාවට බලය තිබිය යුතුය.

(2) දින දෙකක් කල් දීම ඇතිව සභාපති විසින් කවර හෝ අවස්ථාවක කැඳවනු ලබන රැස්වීම්වලට පුස්තකාල කාරක සභාව රැස්විය යුතුය. එබඳු කැඳවීමක් නොමැති අවස්ථාවල යටත් පිරිසෙයින් මාස දෙකකට වරක්වත් එසේ රැස්විය යුතුය. එබඳු රැස්වීම්වල ලේකම් වශයෙන් පුස්තකාලයාධිපති කටයුතු කළ යුතුය.

### පොත් බැහැරට දෙන පුස්තකාලය

7. (1) කිසිම තැනැත්තකු—

(අ) වයස අවුරුදු 14 ට නොඅඩු වුවහොත්,

(ආ) අකුරු කියවීමට දනිත හොත්,

(ඇ) සභාවේ පාලන සීමාව තුල පදිංචිව සිටිත හොත් හෝ තමාගේ කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් එම සීමාව තුළ තිබෙත හොත්,

(ඈ) රුපියල් පහක මුදලක් පුස්තකාලයාධිපති වෙත තැන්පත් කරත හොත් සහ

(ඉ) රුපියල් විසිපහකට නොඅඩු මුදලක් මාසිකව කුලියක් වශයෙන් ලැබෙන, සභාවේ පාලන සීමාව තුල පිහිටි ගෙයක ප්‍රධාන පදිංචිකරුවෙකු හෝ අයිතිකරුවෙකු විසින් නිර්දේශ කරනු ලබත හොත් මිස පොත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඔහු ඇතුළත් කර නොගත යුතුය.

(2) පොත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් වීමට අදහස් කරන සැම තැනැත්තකු විසින් ඒ සඳහා පුස්තකාලයාධිපතිගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රයක ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර, එකී ඉල්ලුම් පත්‍රය පහත සඳහන් යම් තැනැත්තකු විසින් අනුමත කිරීම් වශයෙන් පිටපත් කර තිබිය යුතුය.

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්,

(ආ) සභාවේ සාමාජිකයෙක්,

(ඇ) පුස්තකාල කාරක සභාවේ සාමාජිකයෙක්,

(ඈ) ආගමික පූජකවරයෙක්,

(ඉ) වෛද්‍ය හෝ නීතිඥ වෘත්තියෙහි සාමාජිකයෙක්,

(ඊ) සමාදාන විනිශ්චයකාර වරයෙක්,

(උ) රු. 1,500.00 කට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන රජයේ සේවකයෙක්,

(ඌ) ද්විතීයික පාසැලක විදුහල්පතිවරයෙක්, හෝ

(ඍ) රුපියල් එක්දහස් පන්සියයකට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන සභාවේ සේවකයෙක්.

(3) ඉහත සඳහන් ඡේදය යටතේ ඉල්ලුම් පත්‍රයක් පිටසන් කිරීමට අයිතිවාසිකමක් ඇති යම් කිසි තැනැත්තකුට ඔහුගේ ඉල්ලුම් පත්‍රය පිටසන් කරවා ගැනීමට අවශ්‍ය නොවිය යුතුය.

8. පොත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගනු ලැබූ සැම තැනැත්තකුම පුස්තකාලයාධිපති විසින් අවසර පත්‍ර දෙකක් දිය යුතු අතර ඒ තැනැත්තා ඒ එක් එක් අවසර පත්‍රය පිට පොතක් ලබා ගෙන බැහැරට ගෙන යාමට හිමිකම් තිබිය යුතුය.

9. පොත් පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු තමාට ලැබී තිබෙන අවසර පත්‍රයක් පිට ඒ පුස්තකාලයෙන් බැහැරට ගෙන යන ලද කවර පොතක් වුවද, වගකිව යුතුය.

10. පොත් පත් බැහැරට දෙන පුස්තකාලයේ, සාමාජිකයෙකුට 8 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ, දෙන ලද අවසර පත්‍රයක් නැතිවූ විට ඒ සාමාජිකයා විසින් වහාම ඒ බව පුස්තකාලයාධිපතිට දැන්විය යුතුය. පොත් බැහැරට දෙන පුස්තකාලයේ ඒ ඒ අවසර පත්‍රය පිට පොතක් ගෙන ගොස් නැති වූ බව පුස්තකාලයාධිපති සෑහීමකට පත් වුවහොත්, ඔහු විසින් ඒ සාමාජිකයාට ඒ අවසර පත්‍රයේ දෙවැනි පිටපතක් නිකුත් කළ හැකිය. එහෙත් ඒ අවසර පත්‍රය නැතිවූ බව තමාට දැනුම් දෙන ලද දිනයේ සිට යටත් පිරිසෙයින් තිස් දිනක් ඉකුත් වී ඇතොත් මිස එබඳු දෙවැනි පිටපතක් පුස්තකාලයාධිපති විසින් නිකුත් නො කළ යුතුය.

11. පොත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද යම් පොතක් එය ලබා ගත් දින සිට දින දහහතරක් ඇතුළත පුස්තකාලයාධිපතිට ආපසු භාර දිය යුතුය. ඒ පොත අන්‍ය සාමාජිකයෙකුට අවශ්‍ය නොවුවහොත්, තවත් දවස් දහ හතරක කාල සීමාවකට එය ලබා ගැනීමට පුස්තකාලයාධිපති විසින් ඒ සාමාජිකයාට ඉඩ දිය හැකිය.

12. 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් දින දහහතරේ කාලසීමාව ඇතුළත යම් පොතක් පුස්තකාලයාධිපතිට ආපසු භාරදීමට සාමාජිකයෙකු අපොහොසත් වූ විට, පොත භාර දීමට ප්‍රමාද වන එක් එක් දවසට ශත දහය බැගින් වූ දඩ මුදලක් ගෙවීමට ඔහු බැඳී සිටිය යුතුය.

13. පොත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබා ගන්නා ලද යම් පොතක් 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් දින දහහතරේ කාලසීමාව ඉකුත් වී තිස් දවසක් ඇතුළත ආපසු භාරදීමට අපොහොසත් වූ විට, ඒ පොත නැතිවූවාසේ සැලකිය යුතුය.

14. සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද පොතක් නැති වූ විට නැති වූවා සේ සලකනු ලබන විට ඒ වෙනුවට අලුතින් පොතක් ගැනීම සඳහා යන වියදම ඒ සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

15. පොත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබා ගන්නා ලද කිසිම පොතකට කිසිම සාමාජිකයෙකු විසින් කිසිම අන්දමක හානියක් හෝ අලාභයක් නොකළ යුතුය.

16. පොත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබා ගැනීමට තමා අදහස් කරන යම් පොතකට යම් හානියක් හෝ අලාභයක් සිදුවී ඇතහොත් ඒ බව පුස්තකාලයාධිපතිට දැනුම් දීම සැම සාමාජික

යෙකුගේම යුතුකම විය යුතුය. එවැනි යම් හානියක් හෝ අලාභයක් පුස්තකාලාධිපතිට දැන්වීම ඔහු විසින් පැහැර හරිනු ලැබූ විට, ඒ පොත යම් අලාභයක් හෝ හානියක් සිදුවී නැති හොඳ තත්ත්වයෙන් ඔහුට නිකුත් කරනු ලද්දේ යැයි, සැලකිය යුතුය.

17. සාමාජිකයෙකු විසින් ආපසු ගෙනවිත් භාරදුන් පොතකට, එය නව දුරටත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට ඒ සාමාජිකයා හානිකර තිබේයයි, පුස්තකාලයාධිපති හැඟීමකට පත් වූ විට, ඒ පොත වෙනුවට අලුත් පොතක් ගැනීම සඳහා යන වියදම් ගෙවීමට සාමාජිකයා බැඳී සිටිය යුතුය.

18. (1) පොත් බැහැරට දෙන පුස්තකාලයෙන් කිසිම පොතක් කිසිම සාමාජිකයෙකු විසින් අන් තැනැත්තකුට නොදිය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ විධිවිධාන කඩ කරන යම් සාමාජිකයාගේ තැන්පත් මුදල ඔහුට අහිමි විය යුතු අතර, බැහැරට දෙන පුස්තකාලයේ ඔහුගේ සාමාජිකත්වය ද අහිමි විය යුතුය.

19. (1) යම් බෝවන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන යම් තැනැත්තකු විසින් පාවිච්චි කරන ලදැයි තමා දන්නා කිසිම පොතක් කිසිම සාමාජිකයෙකු විසින් පොත් බැහැරට දෙන පුස්තකලයාට ආපසු භාර නොදිය යුතුය.

(2) පොත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද පොතක් බෝවන රෝගයකින් ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන යම් තැනැත්තකු විසින් පාවිච්චි කර ඇති විට, ඒ පොත විනාශ කර දැමිය යුතු අතර, ඒ පොත වෙනුවට අලුත් පොතක් ගැනීම සඳහා යන වියදම ඒ සාමාජිකයා විසින් පුස්තකාලයාධිපතිට ගෙවිය යුතුය.

20. යම් කිසි එක් පොතක් කවර සාමාජිකයෙකුට ලැබිය යුතුද යන්න පිළිබඳව පුස්තකාලයේදී සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් අතර යම් ආරාවුලක් ඇති වූ විට, පුස්තකාලයාධිපති විසින් ඒ ආරවුල විසඳිය යුතුවාක් මෙන්ම, ඒ පිළිබඳව ඔහුගේ නිගමනය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

21. වෙන සාමාජිකයෙකු විසින් ලබා ගෙන ඇති පොතක් ඔහුගෙන් පසු ලබා ගැනීමට අදහස් කරන කවර සාමාජිකයෙකු වුවද, තමාගේ නම සහ පොතේ නමත් ඒ කාර්යය සඳහා තබා තිබෙන ලේඛනයේ ඇතුළත් කළ යුතු අතර, ඒ පොත එවකට ලබා ගෙන සිටි සාමාජිකයා එය ආපසු ගෙන විත් භාරදුන් විට පුස්තකාලයාධිපති විසින් ලේඛණයෙහි ඇතුළත් කල සාමාජිකයාට එය නිකුත් කළ යුතුය. යම් පොතක් සඳහා සාමාජිකයන් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් ලේඛනයෙහි නම් ඇතුළත් කොට ඇති විට, ලේඛණයෙහි ඒ නම් ඇතුළත් කර ඇති අනුපිළිවෙලට ඔවුන්ට ඒ පොත් නිකුත් කළ යුතුය.

22. යම් සාමාජිකයෙකු සභාවේ පාලන සීමාව තුළ පදිංචිව සිටීම හෝ කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් එහි පවත්වාගෙන යාම නතර කළ විට, පොත් බැහැරට දෙන පුස්තකාලයේ ඔහුගේ සාමාජිකත්වය කෙලවර විය යුතු අතර, 8 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඔහුට නිකුත් කරන ලද අවසර පත්‍ර දෙක ඔහු විසින් පුස්තකාලයාධිපතිට ආපසු භාර දිය යුතුය.

23. 7 (1) (ඇ) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් තැනැත්තකු විසින් ගෙවා ඇති රුපියල් පහේ තැන්පත් මුදල, පොත් පත් බැහැරට දෙන පුස්තකාලයට ඔහුගෙන් අයවිය යුතු යම් මුදලක් වෙතොත් එය අඩු කරගෙන, ඒ තැනැත්තාගේ සාමාජිකත්වය කෙලවර වීමේදී ඔහුට ආපසු ගෙවිය යුතුය.

24. පොත් පත් බැහැරට දෙන පුස්තකාලය, ඉරිදා දිනවලත්, රජයේ නිවාඩු දිනවලත්, තොග ගණන් බැලීම සඳහා කාරක සභාව විසින් යටත් පිරිසෙයින් දින හතකවත් දැන්වීමක් දෙනු ලැබීමෙන් අනුව නියම කරනු ලබන වෙනත් යම් දිනවලත් හැර දිනපතා පෙරවරු 8 සිට 3.30 දක්වා කාලය තුළ විවෘත කර තැබිය යුතුය.

**ආශ්‍රය පුස්තකාලය**

25. කිසිම තැනැත්තකු :—

(අ) ඒ සඳහා පුස්තකාලයාධිපතිගෙන් අවසර ලබාගෙන ඇත්නම්, සහ

(ආ) ආශ්‍රය පුස්තකාලයෙහි තබා තිබෙන ලේඛනයෙහි අත්සන් කර ඇති නම් මිස, තමා විසින් ආශ්‍රය පුස්තකාලයෙන් ප්‍රයෝජනය නොගත යුතුය.

26. පුස්තකාලයාධිපති විසින්—

(අ) අකුරු කියවීමට දන්නාවූ,

(ආ) සභාවේ පාලන සීමාව තුළ පදිංචි කරුවෙකු වූ සහ

(ඇ) වයස අවුරුදු දහහතරට අඩු නොවූ,

යම් තැනැත්තකුට ආශ්‍රය පුස්තකාලයෙන් ප්‍රයෝජනය ගැනීමට අවසර දිය යුතුය.

27. කිසිම තැනැත්තකු විසින් ආශ්‍රය පුස්තකාලයෙහි දී බැලීම සඳහා තමා වෙත නිකුත් කරනු ලැබූ කිසිම පොතක් ආශ්‍රය පුස්තකාලයෙන් බැහැරට ගෙන නොයා යුතුය.

28. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ විධිවිධානවලට යටත්ව ආශ්‍රය පුස්තකාලය පොහෝ දිනයක හෝ රජයේ නිවාඩු දිනයක හැර ඕනෑම දිනයක පෙරවරු 8 ටත් 3.30ටත් අතර කාලය තුල විවෘතව තැබිය යුතුය.

(2) සභාව විසින් :—

(අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කාල වේලාවන් දීර්ඝ කිරීම

(ආ) බඩු ගණන් ගැනීම සඳහා සභාව විසින් නියම කළ හැකි ආශ්‍රය පුස්තකාලය වසා තැබීමට කාරක සභාවට යෝජනා සම්මුතියෙන්ම හැකිය.

**කියවීම් ශාලාව**

29. කිසිම තැනැත්තකු——

(අ) ඒ පුස්තකාලයාධිපතිගෙන් අවසරය ලබා ඇතොත්, සහ

(ආ) කියවීම් ශාලාවේ ඇති ලේඛණයෙහි අත්සන් තබා ඇතොත් මිස, තමා විසින් කියවීම් ශාලාව පාවිච්චි නොකළ යුතුය.

30. (අ) අකුරු කියවීමට දන්නා,

(ආ) සභාවේ පාලන සීමාව තුළ පදිංචිව සිටින, සහ

(ඇ) වයස අවුරුදු දහහතරට අඩුනොවූ යම් තැනැත්තකුට පුස්තකාලයාධිපති විසින් අවසර දිය හැකිය.

31. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ විධිවිධානවලට යටත්ව, පොහෝ දිනයක් හෝ රජයේ නිවාඩු දිනයක් නොවන සතියේ කවර දිනක වුවත් පෙරවරු 8 සිට දහවල් 12 දක්වා වූ කාලය තුල කියවීම් ශාලාව විවෘත කර තිබිය යුතුය.

(2) සභාව විසින්—

(අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ සඳහන් නිශ්චිතව සඳහන් කාලය දීර්ඝ කිරීම.

(ආ) යෝජනාවේ නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි පොහෝය දිනයක හෝ රජයේ නිවාඩු දිනයක යම් යම් කාල වේලා වලදී කියවීම්ශාලාව විවෘත කර තබන ලෙස කාරක සභාවෙන් ඉල්ලා සිටීම හෝ

(ඇ) බඩු ගණන් ගැනීම සඳහා සභාව විසින් නියම කරනු ලබන දින වලදී කියවීම් ශාලාව වසා තබන මෙන් කාරක සභාවට නියම කිරීම යෝජනා සම්මුතියෙන් කළ හැකිය.

32. කියවීම් ශාලාවේ තබා තිබෙන හෝ ඊට අයිති යම් ප්‍රවෘත්ති පත්‍රයක්, වාර සංග්‍රහයක්, සඟරාවක්, සිතියමක්, ලේඛණයක් අත් පිටපතක් හෝ වෙනයම් දෙයක් කිසිම තැනැත්තකු විසින් කියවීම් ශාලාවෙන් පිට ගෙන නොයා යුතුය.

33. යෝජනාවක් මගින් යෝජනාවේ සඳහන් යම් යම් නිශ්චිත කාල සීමාවක් තුළ පොහොය දිනයක හෝ රජයේ නිවාඩු දිනයක ආශ්‍රය පුස්තකාලය, බැහැරට දෙන පුස්තකාලය සහ කියවීම් ශාලාව විවෘත කර තැබීමට සභාව විසින් කාරක සභාවට නියම කළ හැකිය.

සාමාන්‍ය කරුණු

34. බෝවන රෝගයකින්, ස්පර්ෂයෙන් බෝවන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙලෙන හෝ මෑතදී පෙලෙමින් සිට හෝ එවැනි රෝගයකින් පෙළුනු යම් තැනැත්කුට මෑතදී සාත්තු කරමින් සිටි කිසිම තැනැත්තකු විසින් ඒ රෝග බීජ මේරීමට හා රෝගය බෝවීමට ගතවන කාල සීමාව පසුවන තෙක් මහජන පුස්තකාලයට අයත් ස්ථානයට ඇතුලු නොවිය යුතුය.

35. කිසිම තැනැත්තකු විසින් :—

(1) මහජන පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළත හෝ ඒ අසල අනිසි ලෙස හැසිරීම.

(2) සභා ගොඩනැගිල්ලේ කිසිම කොටසකට හෝ මහජන පුස්තකාලය තුළ හෝ ඒ අසල වූ සභාවට අයත් කිසිම දේපලකට හානියක් කිරීම හෝ එය මොනම අන්දමකින් වත් විරූපී කිරීම.

(3) තමා ගැන සතුටුදායක විස්තරයක් කිරීමට නොහැකිව මහජන පුස්තකාලය වැසීමෙන් පසු ඒ පුස්තකාලයට අයිති ස්ථානයෙහි සිටීම හෝ නිකරුනේ ගැවසීම.

(4) මහජන පුස්තකාලයට අයත් ස්ථානය ඇතුළත දුම් බීම හෝ කෙළ ගැසීම.

(5) මහජන පුස්තකාලයට අයත් ස්ථානය ඇතුළතදී දාදු කෙළීම, හෝ කඩදාසි කුට්ටමෙන් සූදු කෙළීම හෝ අන් කිසි ක්‍රීඩාවක් කිරීම.

(6) මහජන පුස්තකාලයට අයත් ස්ථානය ඇතුළතදී කෑ ගැසීමෙන් හෝ සින්දු කීමෙන් හෝ වෙනයම් ඝෝෂාවක් කිරීමෙන් මහජන පුස්තකාලය පාවිච්චි කරන්නන්ට කරදර කිරීම.

(7) අපිරිසිදු තත්වයකින් මහජන පුස්තකාලයට අයත් ස්ථානය තුළට ඇතුළු වීම.

(8) මහජන පුස්තකාලයට අයත් ස්ථානය තුළට යම් බල්ලකු හෝ වෙනයම් සතෙකු ගෙන ඒම.

(9) මහජන පුස්තකාලයට අයත් ස්ථානයේ යම් කොටසක නිදා ගැනීම හෝ කිසියම් ආහාරයක් ගැනීම.

(10) මේ අතුරු ව්‍යවස්ථා යටතේ තමා වෙත පැවරී ඇති බලතල නිත්‍යානුකූලව පාවිච්චි කිරීමේදී පුස්තකාලයාධිපතිට හෝ ඔහුගේ අණ පරිදි ක්‍රියා කරන යම් තැනැත්තකුට අවහිර කිරීම නොකළ යුතුය.

36. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"සභාපතිතුමා වශයෙන්" ගම් සභාවේ සභාපති තුමාද,

"ගම් සභාව" යනුවෙන් මැදිරිගිරිය ගම් සභාවද,

"ගම්සභා ප්‍රදේශය" යනුවෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ගම්සභා ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

කේ. ඇම්. පොඩි නිලමේ,
මැදිරිගිරිය ගම්සභාවේ සභාපති.

1973.09.29,
මැදිරිගිරිය ගම්සභා කාර්යාලය,
දියසෙන් පුර,
මැදිරිගිරිය.

10–309—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින්, (261 වැනි අධිකාරය වන) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද සංශෝධිතයට දක්වහා XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත්, එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට ඌව බින්තැන්න ගම් ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, ඌව බින්තැන්න ගම්සභා ප්‍රදේශයේ පාලන නිලධාරි අභයසිංහ මුදියන්සේලාගේ මුතුබණ්ඩා අභයසිංහ වන මම තීරණය කරමි.

ඒ. එම්. එම්. බී. අභයසිංහ,
පාලන නිලධාරි,
ඌව බින්තැන්න ගම් ප්‍රදේශය.

1973 සැප්තැම්බර් මස 28 වැනි දින,
ඌව බින්තැන්න ගම් ප්‍රදේශයේ,
මහියංගන ගම්සභා කාර්යාලයේ දීය.

අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරණ ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කාණ්ඩයෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එකී 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"i. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහිවූ උපලේඛනයෙහි අවස්ථෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක අදහස් වේ", තවද

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :

උපලේඛනය

I වැනි කොටස

අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළුගල් කැණීම.

කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම.

සිසිල් බීම නිෂ්පාදනය.

ග්‍රොස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම.

අයිස් නිපදවීම.

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිශ්කර්ෂණය.

ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබා ගැනීම.

පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ගිනිපෙට්ටි නිෂ්පාදනය.

ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩා කර තබා ගැනීම.

ඉඹුල් පුළුන් හෝ කපු හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම.

මැතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.

තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පිදුරු ගබඩා කර තබා ගැනීම.

පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම.

කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම.

ධාන්‍ය හෝ මාෂ භෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

අතින් ලී ඉරණ ඉරුම් වලක් හෝ මෝලක් පවත්වාගෙන යෑම.

දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.

දර ගබඩාවක් පවත්වාගෙන යෑම.

හිරිගල් හෝ හුණු ගල් සඳහා හෑරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්මලක් පවත්වාගෙන යෑම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්මලක් පවත්වාගෙන යෑම.

තොග වශයෙන් විකිණීම සඳහා, පිටි, ලුණු, හෝ සීනි හොණ්ඩර 15 වට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

හිස් බෝතල් හෝ හිස් යෝනි ගබඩා කර තබා ගැනීම.

බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යෑම.

අළුත් හෝ පාවිච්චි කරණ ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පොල්කටු ගබඩාකර තබා ගැනීම.

ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පාවිච්චි කරණ ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.

විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.

සිල්ක් සහ කෘත්‍රිම රෙදි වියීම හා විසිතුරු කිරීම.

මැසූ ඇඳුම් නිෂ්පාදනය.

මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

## II වැනි කොටස

### අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පෝර හෝ රසායනික පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

හම් ගබඩා කර තබා ගැනීම.

උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.

කුකුලන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යෑම.

බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.

රබර් නිෂ්පාදනය හෝ ගබඩා කර තබා ගැනීම.

පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යෑම.

පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

කරවල, ලුනු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.

අඟුරු සඳහා දැව හෝ පොල් කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.

සිමෙන්ති හොණ්ඩර 25 වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම.

පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම.

සබන් නිෂ්පාදනය කිරීම.

සව් හෝ මඤ්ඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.

ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.

ට්‍රන්ක් පෙට්ටි සෑදීම.

අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

මෙරට හෝ රට වේවැල් වලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.

කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.

සිරප් හෝ පලතුරු බීම වර්ග සෑදීම.

රස කැවිලි වර්ග නිපදවීම.

පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.

මේද නිපදවීම හෝ නිෂ්කර්ශණය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.

දත් බුරුසු නිපදවීම.

රා එකතු කරණ ස්ථානයක් පවත්වාගෙන යෑම.

විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

හුණුගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.

පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.

සෝඩා නිපදවීම.

කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.

සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.

පලතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම.

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ භෝග කෙටීම.

බේකිං පව්ඩර් නිපදවීම.

මාජරින් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.

පොට් නිපදවීම.

ඉටිපන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

සායම් කුඩු නිපදවීම.

ලාකඩ නිපදවීම.

සුවඳ පුයර නිපදවීම.

රෙදි සෝදන නිල් නිපදවීම.

පාසල් රටහුණු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසල් ගල් ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම සහ ගබඩා කර තබා ගැනීම.

සීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම.

කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.

මැණික් ගල් කැපීම හා ඔප දැමීම.

දියහුණු, සුදු (වෛටිං) හුණු හෝ හිරියල් නිපදවීම.

එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

## III වැනි කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු, එන්සාල් (කරදමුංගු) හෝ කෙඳි වර්ග සකස් කිරීම.

ඩ්‍රයි ක්ලීනිං කරණ ස්ථානයක් හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.

රෙදි මුද්‍රණය කරණ හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

තෙල් හෝ සත්ව මේද පැසවීම.

හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම. මැටි බඳුන් ඔප දැමීම.

ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

හොණ්ඩර 3 ට වැඩියෙන් තෝ ගබඩා කර තබා ගැනීම.

බැටරි චාජ්කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

වෑල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම වැඩපලක් පවත්වාගෙන යෑම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යෑම.

බෙලෙක් වැඩ පොලක් පවත්වාගෙන යෑම.

ගල් ස්මාරක නිපදවීම.

පැට්‍රෝල්, ඩීසල් තෙල් වෙනත් යම් ඛණිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම.

පැට්‍රෝල් නිකුත් කරණ ස්ථානයක් පවත්වාගෙන යෑම.

පොලිෂ් ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම.

මදුරු කව (කොයිල්ස්) නිපදවීම.

ලී දඹු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.

ගල් නාර හෝ වෙනත් බිටුමන් මය නිෂ්පාදන නිපදවීම.

වීදුරු භාණ්ඩ නිපදවීම.

වීදුරු කැඩපත් නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්සන ඊයම් නිපදවීම.

ඇලුමිණියම් භාණ්ඩ නිපදවීම.

කටු කම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප ගබඩා ටැංකි නිපදවීම.

ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර සීතකරණ හෝ අයිස් ශීතකාරක (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම.

සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවූනු කෙඳි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියේටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපද වන වැඩපලක් පවත්වාගෙන යෑම.

10–281—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත් එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට ආනවිළුන්දන් පත්තු ගම්සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, 1973. 08. 30 වැනි දින රැස්වීමේ අංකය 7 (ආ) දරණ යෝජනාවෙන් සභාසම්මත වූ බව මෙයින් දන්වමි.

එම්. ඩී. යාපා,
ආනවිළුන්දන් පත්තු ගම් සභාවේ සභාපති.

1973 සැප්තැම්බර් මස 24 වන දින,
රාජකදළුව, ආරච්චිකට්ටුවේ,
ආනවිළුන්දන් පත්තු ගම් සභා කාර්යාලයේදීය.

### අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:—

"(1) මෙම අතුරු ව්‍යවස්ථාවල" අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ" තවද,

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන්:—

### උපලේඛනය

#### I වැනි කොටස—අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරලු හෝ කලුගල් කැනීම.

කබුක්, බොරලු හෝ කලුගල් ගබඩා කිරීම.

සිසිල් බීම නිෂ්පාදනය කිරීම.

ග්‍රෝස් එකකට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම, බෝතල් ගබඩා කර තබා ගැනීම.

අයිස් නිපදවීම.

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එලවලු තෙල් නිෂ්කර්ශනය.

ගැලොම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තැබීම.

පොල් තෙල් හැර වෙනත් එලවලු තෙල් වර්ගයක ගැලුම 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ගිනි පෙට්ටි නිෂ්පාදනය.

ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩා කර තබා ගැනීම.

ඉඹුල් පුලුන් හෝ සුදු හෝ කපු පුලුන් ගබඩා කර තබා ගැනීම.
මැතිලේටඩ් ඉස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තැබීම.

ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පිදුරු ගබඩා කර තබා ගැනීම.

පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම.

කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම.

ධාන්‍ය හෝ මාෂ භෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත් වැඩියා කිරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.

අතින් ලී ඉරන ඉරුම්වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.

දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.

දර ගබඩාවක් පවත්වා ගෙන යෑම.

හිරි ගල් හෝ හුනු ගල් සඳහා හෑරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යෑම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරණ කම්හලක් පවත්වාගෙන යෑම.

තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම.

බයිසිකල් හෝ මෝටර් සයිකල් අලුත් වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම.

අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පොල්කටු ගබඩා කර තබා ගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොන්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.

සිල්ක් හා කෘතිම රෙදි විවීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

II වැනි කොටස—අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

හම් පදම් කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.

හම් ගබඩා කර තබා ගැනීම.

උම්මලකඩ ගබඩා කර තබා ගැනීම.

කුකුළන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වා ගෙන යාම.

බැටළුවන්, ඌරන් හෝ එළුවන් 10 කට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වා ගෙන යාම.

රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වා ගෙන යාම.

පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුලු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

කරවල, ලූනු, මාලු, ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

මාලු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම, හෝ අයිස් දැමීම.

අඟුරු සඳහා පොල් කටු හෝ දැව දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.

සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම.

පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

සත්ව ආහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම.

සබන් නිෂ්පාදනය කිරීම.

සව් හෝ මයියොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.

ඇට කටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යාම.

ට්‍රන්ක් පෙට්ටි සෑදීම.

අලුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

මෙරට හෝ රට වේවැල් වලින් භාණ්ඩ සෑදීම හෝ එයින් සාදන ලද භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.

සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.

රස කැවිලි වර්ග නිපදවීම.

පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වා ගෙන යාම.

මේද නිපදවීම හෝ නිෂ්කර්ශනය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු නිෂ්පාදනය කිරීම.

දත් බුරුසු නිෂ්පාදනය කිරීම.

රා එකතු කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.

විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

හුණු ගල් හෝ හුනු ගබඩා කර තබා ගැනීම.

පෑණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් නිෂ්පාදනය කිරීම හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ලෑලි සකස් කිරීම හෝ පදම් කිරීම.

සෝඩා නිපදවීම.

කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියළි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.

සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම.

පළතුරු, මාලු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුලු බඩු හෝ පිටි ඇඹරීම.

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ භෝග කෙටීම.

බේකින් පව්ඩර් නිපදවීම.

මාජරින් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.

පොට් නිපදවීම.

ඉටි පන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත, හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

රෙදි සෝදන නිල් නිපදවීම.

සායම් කුඩු නිපදවීම.

ලාකඩ නිපදවීම.

සුවඳ පුයර නිපදවීම.

පාසැල් රටහුනු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම.

ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය කිරීම.

වැලිකඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසැල් ගල් ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවා කඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම.

ශීත කළ මාලු හෝ මස් හෝ ගබඩා කර තබා ගැනීම.

කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.

මැණික් ගල් කැපීම හා ඔප දැමීම.

දියහුණු සුදු (වයිට්වොෂ්) හුණු හෝ ශිරියල් නිපදවීම.

එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වියළීම.

III වැනි කොටස—අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චිකොට කුරුඳු, (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.

ඩ්‍රයි ක්ලීනින් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.

රෙදි මුද්‍රණය කරන සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

තෙල් හෝ සත්ව මේද පැසවීම.

හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම.

ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

බැටරි චාර්ජ් කිරීම හෝ අලුත් වැඩියා කිරීම.

වෑල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත් වැඩියා කිරීම සඳහා වැඩපොළක් පවත්වාගෙන යාම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.

බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.

ගල් ස්මාරක නිපදවීම.

පැට්‍රෝල්, ඩීසල් තෙල් හෝ වෙනයම් ඛනිජ තෙල් ගබඩා කර ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.

පැට්‍රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කවා (කොයිල්) නිපදවීම.

ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ රබර් ගිමෙන්ති නිපදවීම.

ගල් නාර හෝ වෙනත් බිටුමන් මය නිෂ්පාදන නිපදවීම.

වීදුරු භාණ්ඩ නිපදවීම්.

වීදුරු කැඩපත් නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස් සහ ඊයම් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටු කම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.

ජී. අයි. බල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර, සීතකරණ හෝ අධි සිතකරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම.

සර්විස් කිරීම හෝ අළුත් වැඩියා කිරීම.

බ්රේක් ලයිනින් ග් හෝ ක්ලච් ලයිනින් ග් නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුණු රෙදි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

වියලි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

රන් කම් සුන් බුන් වලින් වටින් ලෝහ නිෂ්කර්ශනය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

ට්‍රැක් ටර්රථ එකලස් කිරීම.

රේඩියේටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩපොළක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කරණ වැඩ පොලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පොලක් පවත්වාගෙන යාම.

10–279—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රාදේශීය බලමණ්ඩල (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනත**

ප්‍රාදේශීය බලමණ්ඩල (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ ගාළු දිස්ත්‍රික්කයේ නෙළුව ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් මෙම යෝජනාව ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලවන දින සිට ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි සම්මත කරනු ලැබේ.

"අ"—පළාත් පාලන කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයකින් ප්‍රකාශ කරණ ලද්දාවූද පොදු ආදශී අතුරු ව්‍යවස්ථා මාලාවේ 1 කාණ්ඩයේ සිට 37 වැනි කාණ්ඩය දක්වාද,

"ආ"—1963 ජූනි මස 21 දින අංක 13,679 දරණ රජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද්දාවූද බව 1965 ජනවාරි මස 8 දින අංක 14,287 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද පොදු අතුරු ව්‍යවස්ථා මාලාවේ 38 වැනි කාණ්ඩයද,

"ඇ"—1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ රජයේ ගැසට් පත්‍රයේ පල කරණ ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 දින අංක 14,835 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා මාලාවේ 39, 40 සහ 41 වැනි කාණ්ඩද,

"ඈ"—රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශීය කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් 1972 ජනවාරි මස 7 වැනි දින දාතමින් (261 වන අධිකාරය) වන ප්‍රදේශකාරී සභා "පොදු සම්මත අතුරු ව්‍යවස්ථා" පනතේ 2 වගන්තිය ප්‍රකාර අංක 15,001, 1972 මාර්තු මස 10 වන දින රජයේ ගැසට් පත්‍රයේ පලවූ සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 18 වැනි කාණ්ඩයේ අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල සංශෝධිත අතුරු ව්‍යවස්ථා උපලේඛනය සම්පූර්ණයෙන්ද,

"ඉ"—රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශීය කටයුතු භාර ඇමතිතුමා විසින් ප. පා. ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (4) වගන්තිය යටතේ සම්පාදිතව 73. 6. 29 දින දරණ අංක 66 ගැසට් පත්‍රයේ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කර ඇතැයි පල කරන ලද 72. 11. 03 දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ IV කොටසේ පලවූ පොදු අතුරු ව්‍යවස්ථා මාලාවේ 42 කාණ්ඩය වූ පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාවද;

මේ යෝජනාව ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කර ගැනීමට ගාළු දිස්ත්‍රික්කයේ නෙළුව ගම්සභාව විසින් 1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා "පොදු අතුරු ව්‍යවස්ථා" ආඥාපනතේ 3 වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

පී. සමරනායක,
නෙළුව ගම්සභාවේ සභාපතිතුමා.

73. 09. 21 වැනි දින දීය.

10–328—73.10.12 දින අංක 81 දරන ගැසට් පත්‍රය

---

**වැලිපැන්න ගම් සභාව**

**ගෝ ඝාතක ආඥාපනත**

මෙහි පහත ඇති උපලේඛනයෙහි දක්වෙන අය විසින් 1974 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බල පත්‍රයක් නිකුත් කිරීම ගැන වැලිපැන්න ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | පිහිටි ස්ථානය |
| --- | --- | --- |
| ඒ. අයි. කබීර් ... ... ... | ගවමස් ... | අංක 7, වැලිපැන්න පොදු වෙළඳ පොල |

වැලිපැන්න ගම්සභාවේ සභාපති.

1973.9.29 වැනි දින,
වැලිපැන්න ගම්සභා කාර්යාලය,
ගල්මත්ත,
වලගෙදර.

10–326—73.10.12 දින අංක 81 දරන ගැසට පත්‍රය

---

**තෙල්දෙණිය නගරය**

**1974 වර්ෂයේ දේපල බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 159 වැනි වගන්තිය යටතේ 1973 වර්ෂයට පනවන ලද දේපල බද්ද, 1974 වර්ෂයටද එලෙසම පැනවීමට තෙල්දෙණිය නගරයේ විශේෂ කොමසාරිස් වන මා විසින් තීරණය කර ඇති බවත්, මෙම නගර සීමාව තුල පිහිටි සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට අට බැගින් වූ දේපල බද්ද පිලිවෙලින් 1974 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවා අවසාන කිරීමට හැකි බවත් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ඇම්. ඒ. පී. පෙරේරා,
තෙල්දෙණිය නගරයේ විශේෂ කොමසාරිස්.

1973 සැප්තැම්බර් මස 22 වැනි දින,
තෙල්දෙණියේ විශේෂ කොමසාරිස් කාර්යාලයේදීය.

10–325—73.10.12 දින අංක 81 දරන ගැසට් පත්‍රය

### පුන්ඩලුඔය සුළු නගර සභාව

1974 වර්ෂය සඳහා සුනඛයන් පිළිබඳ බද්ද

සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරිය) 4 වැනි වගන්තිය යටතේ පුන්ඩලුඔය සුළු නගර සභා බල මණ්ඩලය තුල තබාගෙන සිටින සෑම බල්ලෙක් සඳහා රු. 1.00 ක් බැගින්ද, සෑම බැල්ලක් සඳහා රු. 1.50 බැගින්ද, 1974 මාර්තු මස 31 වැනි දිනට හෝ එදිනට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් පනවා අය කිරීමටද පුන්ඩලුඔය සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති,
පුන්ඩලුඔය සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 28 වැනි දින,
පුන්ඩලුඔය සුළු නගර සභා කාර්‍යාලයේදීය.

10-319/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

### පුන්ඩලුඔය සුළු නගර සභාව

1974 වර්ෂයට දේපල බද්ද

(256 වැනි අධිකාරිය වන) සුළු නගර සභා ආඥා පනත යටතේ ගෙවී ගෙන යන මෙම වර්ෂයට බල පවත්නා පහත සඳහන් දේපල බදු 1974 වර්ෂයටද එලෙසම පැනවීමට පුන්ඩලුඔය සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට නවය බැගින් වූ වාර්ෂික බද්ද, පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති,
පුන්ඩලුඔය සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 28 වැනි දින,
පුන්ඩලුඔය සුළු නගර සභා කාර්‍යාලයේ දීය.

10-319/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

### පුන්ඩලුඔය සුළු නගර සභාව

1974 වර්ෂය සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

පුන්ඩලුඔය සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

1. සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරිය) 161 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ දක්වෙන ගණන් අනුව 1974 වර්ෂයට රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද පනවා අය කරන බවත්,

2. යථොක්ත ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1973 මාර්තු මස 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්ය.

#### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි හෝ කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පා පැදි හැර වෙන ඕනෑම අන් දමේ වාහනයක් සඳහා ... | 5 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පා පැදියක් හෝ පා පැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත්, රෝදත්‍රයේ පා පැදියක්, මෝටර් රථයක් හෝ කරත්තයක් — | |
| (ඒ) වෙළදාම සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 5 0 |
| (බී) වෙළදාම හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 0 |
| සෑම කරත්තයක් සඳහා ... ... | 4 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 4 0 |
| සෑම රික්ෂෝවක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක් පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා ... | 5 0 |
| සෑම බුරුවෙක් සඳහා ... ... | 1 0 |

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති,
පුන්ඩලුඔය සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 28 වැනි දින,
පුන්ඩලුඔය සුළු නගර සභා කාර්‍යාලයේදීය.

10-319/3—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

### පුන්ඩලුඔය සුළු නගර සභාව

ජලනල ගාස්තු

සුළු නගර සභා ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 25 වන කාණ්ඩයේ 40(1) වගන්තිය අනුව පුන්ඩලුඔය සුළු නගර සභා ප්‍රදේශයේ මෙහි පහත සඳහන් පුද්ගලික ජලනල සඳහා, එහි සඳහන් අයුරු ගාස්තු 1974 වර්ෂය සඳහා අය කිරීමට පුන්ඩලුඔය සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | රු. ශ. |
|---|---|
| පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලදී ගෙවා අවසන් කල හැකි පරිදි මාස තුනකට වරක් ගාස්තු— | |
| ගෙදරදොරේ කටයුතු සඳහා නිවසකට ... | 5 0 |
| පූජනීය ස්ථානයකට, එනම් පල්ලියකට, පන්සලකට හෝ කෝවිලකට ... ... | 3 0 |

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති,
පුන්ඩලුඔය සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 28 වැනි දින,
පුන්ඩලුඔය සුළු නගර සභා කාර්‍යාලයේදීය.

10-319/4—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

### කන්තලේ ගම්සභාව

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1974 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම් කර සිටින හෙයින් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන කන්තලේ ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දිනයේ සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ ආඥාපනතින් සංශෝධිත අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දනුම් දෙමි.

ඩබ්ලිව්. ඈම්. කිරිබණ්ඩා,
කන්තලේ ගම් සභාපති.

1973 ඔක්තෝබර් මස 1 දින,
කන්තලේ ගම්සභාවේ දී ය.

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|---|
| ඇම්. එච්. ඒ. රෂාක් ... | අංක 154, යුනිට් 2, පේරාරු—කන්තලේ ... | හරක් මස් ... | අංක 86 දරණ වත්ත |

10–333—73.10.12 දින අංක 81 දරන ගැසට් පත්‍රය

**කැකිරාව සුළු නගර සභාව**

සුළු නගර සභා ආඥාපනත

1974 වර්ෂයට දේපල බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනත යටතේ මෙම ගත වී යන අවුරුද්දට බලපවත්නා පහත සඳහන් වරිපනම් බදු මෙම සුළු නගර සභා ප්‍රදේශය තුළ 1974 වර්‍ෂයටත් එලෙසම පැනවීමට කැකිරාව සුළු නගර සභාවේ පාලන නිලධාරි, එස්. එන්. බී. ඩබ්. එම්. මන්ත්‍රීපාල වන මම තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල (කුඹුරු, මුඩුබිම් හැර) වාර්ෂික වටිනාකමින් සියයට පහ බැගින් වූ වාර්ෂික බද්දක් පිළිවෙළින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු හතරකට ගෙවිය යුතු වේ.

එස්. එන්. බී. ඩබ්. එම්. මන්ත්‍රීපාල,
පාලන නිලධාරි,
කැකිරාව සුළු නගර සභාව,

1973 සැප්තැම්බර් මස 21 දින,
කැකිරාව සුළු නගර සභා කාර්යාලයේ දීය.

10-401—73.1012 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

**මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු පල්ලේගම්පහ උතුරු ගම් සභාව**

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අයවලුන් විසින් එහි දක්වෙන ස්ථානයේ 1974 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බැවින් ඒ අනුව, බලපත්‍ර නිකුත් කිරීම ගැන හාරිස්පත්තු පල්ලේගම්පහ උතුරු ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවිය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වෙනි අධිකාරය) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| අංකය | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1 ... | ඇම්. ෂෙරිප්දීන්, බැබිලගොල්ල, ගල්හින්න ... ... ... | ගව මස් විකිණීම ... | බැබිලගොල්ල |
| 2 ... | ඇම්. ඒ. ජෙමාල්දීන්, බැබිලගොල්ල, ගල්හින්න ... ... ... | ගව මස් විකිණීම ... | බැබිලගොල්ල |

ඒ. ඇම්. මුදලිනාමි,
හාරිස්පත්තු පල්ලේගම්පහ උතුරු ගම්සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 01 වෙනි දින,
හාරිස්පත්තු පල්ලේගම්පහ උතුරු ගම්සභා කාර්‍යාලය,
අංකුඹුර.

10-463—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ. යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| ඔක්තෝබර් | ... | 5.10.73 | සිකුරාද | ... | 28. 9.73 | සිකුරාද | දහවල් 12.00 |
| | | 12.10.73 | සිකුරාද | ... | 5.10.73 | සිකුරාද | දහවල් 12.00 |
| | | 19.10.73 | සිකුරාද | ... | 12.10.73 | සිකුරාද | දහවල් 12.00 |
| | | 26.10.73 | සිකුරාද | ... | 19.10.73 | සිකුරාද | දහවල් 12.00 |
| නොවැම්බර් | ... | 2.11.73 | සිකුරාද | ... | 26.10.73 | සිකුරාද | දහවල් 12.00 |
| | | 9.11.73 | සිකුරාද | ... | 2.11.73 | සිකුරාද | දහවල් 12.00 |
| | | 16.11.73 | සිකුරාද | ... | 9.11.73 | සිකුරාද | දහවල් 12.00 |
| | | 23.11.73 | සිකුරාද | ... | 16.11.73 | සිකුරාද | දහවල් 12.00 |
| | | 30.11.73 | සිකුරාද | ... | 23.11.73 | සිකුරාද | දහවල් 12.00 |
| දෙසැම්බර් | ... | 7.12.73 | සිකුරාද | ... | 30.11.73 | සිකුරාද | දහවල් 12.00 |
| | | 14.12.73 | සිකුරාද | ... | 7.12.73 | සිකුරාද | දහවල් 12.00 |
| | | 21.12.73 | සිකුරාද | ... | 14.12.73 | සිකුරාද | දහවල් 12.00 |
| | | 28.12.73 | සිකුරාද | ... | 21.12.73 | සිකුරාද | දහවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.